සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 13 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණ, 2019 ජූලි
General Certificate of Education (Adv. Level), Grade 13, Year End Test, July 2019

ආර්ථික විද්‍යාව I
Economics - I

21 S I

පැය 02 යි
Two hours

විභාග අංකය:...

උපදෙස්: * සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* ප්‍රශ්න අංක 01 සිට 50 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු තෝරා ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉරමත ලියන්න.

1. පහත දෑ අතුරෙන් අභිමතානුරූපී ප්‍රකාශය හඳුනාගන්න.
   1. වසරකට ජීවිත 20000 ක් අහිමි කරමින් දුම්කොළ සමාගම දිනකට රුපියල් කෝටි 40 ක ආදායමක් ලබාගනී.
   2. රට තුළ බීජ බෝංචි අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට බෝංචි බීජ ආනයනය කළ යුතුය.
   3. වැරදිකරුවන් වන රියැදුරන්ට ගෙවීමට සිදුවන තැපැල් ගාස්තුව දඩ මුදලින් 10% ක ප්‍රමාණයකි.
   4. වසර 16 කට පසු ශ්‍රී ලංකාවේ අඩුම ආර්ථික වර්ධන වේගය වාර්තා කළේ 2017 වර්ෂයේ ය.
   5. අසීමිත වුවමනා සපුරාලීමේ සම්පත් ආර්ථිකය සතුව ඇත්තේ සීමිත ප්‍රමාණයකි. (..................)

2. නූතන ආර්ථිකයේ වර්ධනය වෙමින් පවත්නා රාජ්‍ය නොවන සංවිධාන සතු කාර්යභාරය කවරේ ද?
   1. ආර්ථික හා පෞද්ගලික අයිතිවාසිකම්කම් ආරක්ෂා කර දීම.
   2. නීති රීති ව්‍යවස්ථාවන් සැකසීම්
   3. දිළිඳුකම තුරන් කිරීමට දායකවීම
   4. සේවක අයිතිවාසිකම් ආරක්ෂා කර දීම
   5. සේවා නියුක්තියට, නිෂ්පාදන තාක්ෂණයට, වැටුප් මට්ටමට බලපෑම් කිරීම (..................)

3. පහත දැක්වෙන්නේ එක්තරා ආර්ථිකයක් සම්බන්ධ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයකි.



ඉහත තොරතුරු අනුව A ලක්ෂ්‍යයේ සිට B ලක්ෂ්‍යය දක්වා ගමන් කිරීමේදී එම ආර්ථිකය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,
   1. ආර්ථික අවපාත තත්ත්වයන් පෙන්වන අතර එහිදී සම්පත් විනාශ වීමක් දක්නට ඇත.
   2. ආර්ථිකයේ මූර්ත නිෂ්පාදනය අඛණ්ඩව දිගුකාලීනව පහළ යාමක් පෙන්නුම් කර ඇත.
   3. සම්පත් විනාශ වීමකින් තොරව ආර්ථික පසුබෑමක් පෙන්නුම් කර ඇත.
   4. වර්තමාන පරිභෝජනය හා අනාගත පරිභෝජනයට සම්පත් යොදා වෙන්කිරීම පෙන්නුම් කර ඇත.
   5. සම්පත් සම්භාරය අඩුවී නිෂ්පාදන හැකියාව අඩුවන ආකාරය පෙන්නුම් කර ඇත. (..................)

4. කාරක ප්‍රාග්ධනය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
   1. භාවිතයට ගැනෙන කාලය මුළුල්ලේ ම කිසියම් ප්‍රතිලාභ ප්‍රමාණයක් හිමිකරුට ලබාදෙයි
   2. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අඛණ්ඩව යෙදවිය හැකි වෙයි.
   3. රටක ඉදිරි නිෂ්පාදන සැලසුම් සකස් කිරීමේදී වැදගත් වෙයි.
   4. ශ්‍රමිකයාගේ ඵලදායිතාව වැඩි කරගැනීමට දායක වෙයි.
   5. ආර්ථික භාණ්ඩ හා සේවා නිෂ්පාදන ක්‍රියාවලිය පහසු කරවයි. (..................)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

5. පාන් සඳහා ඉල්ලුම් වක්‍රය පිළිබිඹු කරන සමීකරණය Qd=100-2p වෙයි. එම සමීකරණයේ සිට Qd=80 - 2p ලෙස වෙනස් වීමට බලපෑ හේතු වනුයේ,
1. පාන් පාරිභෝගිකයන්ගේ අභිරුචිය ඉහල යාමකි.
2. පාන් පාරිභෝගිකයින් මත බද්දක් පැනවීමයි.
3. පාන් නිෂ්පාදකයින්ට සහනාධාරයක් ලබා දීමයි
4. බටර් මිල පහළ යාමයි
5. පාන් මිල පහළ යාමයි (..................)

6. එක්තරා භාණ්ඩයක එක් පාරිභෝගිකයෙකුගේ ඉල්ලුම් මිල ශ්‍රිතය පහතින් දැක්වේ.
P = 10 - 5Qd මෙම ශ්‍රිතයට සමාන පාරිභෝගිකයන් දස දෙනකු වෙළෙඳ පොළෙහි සිටි නම් වෙළෙඳ පොළෙහි ඉල්ලුම් ශ්‍රිතය වනුයේ,
1. P = 100 - 50 Qd
2. Qd = 100 - 5p
3. Qd = 20 - 2P
4. 10 - 2Qd
5. Qd = 20 - P

(..................)

7. එක්තරා භාණ්ඩයක ඉල්ලුම් වක්‍රයට අදාල ඉල්ලුම් ශ්‍රිතය පහත පරිදි වෙයි.
Qd=200-5p
ඉහත භාණ්ඩයේ ඉල්ලුම් නම්‍යතාව එකට සමාන වනුයේ කවර මිලේදී ද?
1. රු 10 දී ය.
2. රු 15 දී ය
3. රු 20 දී ය
4. රු 25 දී ය
5. රු 30 දී ය

(..................)

8. එක්තරා භාණ්ඩයක මිල 4% කින් ඉහළ ගිය අතර අලෙවි ප්‍රමාණය 2% කින් ඉහළ ගියේ නම් නිෂ්පාදකයාගේ අයභාරය ආසන්න වශයෙන් ඉහළ යනුයේ,
1. 10% කිනි
2. 8% කිනි
3. 7% කිනි
4. 6%කිනි
5. 4% කිනි

(..................)

9. පහතින් දැක්වෙන්නේ සමාන පරිමාණයන් ගෙන් යුක්තව A B C D භාණ්ඩ හතර සඳහා අදාළ ඉල්ලුම් වක්‍රයන් ය.

A B C D



(..................)

අලෙවිකරුවන් වැඩි කරගැනීමේ අපේක්ෂාවෙන් සැපයුම්කරුවන් කටයුතු කරයි නම් පහත ක්‍රියා මාර්ග අතරින් නොගැලපෙන ක්‍රියාමාර්ගය දක්වෙන ප්‍රකාශය ඇතුළත් පිළිතුර කුමක් ද?
1. C භාණ්ඩයේ මිල වෙනස් නොකිරීම හා A භාණ්ඩයේ මිල අඩු කිරීම
2. A භාණ්ඩයේ මිල 10% කින් අඩු කිරීම හා B භාණ්ඩයේ මිල 5% කින් ඉහළ දැමීම
3. C භාණ්ඩයේ මිල වෙනස් නොකිරීම හා B භාණ්ඩයේ මිල 10% කින් වැඩි කිරීම
4. D භාණ්ඩයේ මිල 10% කින් වැඩි කිරීම හා A භාණ්ඩයේ මිල 10% කින් අඩු කිරීම
5. A B C D යන භාණ්ඩ වර්ග හතරෙහි ම මිල 10% කින් ඉහළ දැමීම (..................)

10. එක්තරා භාණ්ඩයක සැපයුම් වක්‍රයට අදාල සැපයුම් සමීකරණය පහත පරිදි වෙයි.
Q = 6 + 2p
1. ඕනෑ ම ලක්ෂයක නම්‍යතාව 1ට අඩු වන අතර මිල වැඩිවන විට නම්‍යතා සංගුණකයේ අගය වැඩි වෙයි.
2. සැපයුම් වක්‍රයෙහි ඕනෑම ලක්ෂ්‍යයක නම්‍යතාව 1 ට අඩු වන අතර මිල වැඩිවන විට නම්‍යතා සංගුණකයේ අගය අඩුවෙයි.
3. සැපයුම් වක්‍රයෙහි ඕනෑම ලක්ෂ්‍යයක නම්‍යතාව 1 ට වැඩි වන අතර මිල වැඩිවන විට නම්‍යතා සංගුණකයේ අගය වැඩි වෙයි.
4. සැපයුම් වක්‍රයෙහි ඕනෑම ලක්ෂ්‍යයක නම්‍යතාව 1 ට අඩු වන අතර මිල වැඩිවන විට නම්‍යතා සංගුණකයේ අගය ස්ථාවර වෙයි.
5. සැපයුම් වක්‍රයෙහි ඕනෑම ලක්ෂ්‍යයක නම්‍යතාව ස්ථාවර වන අතර මිල වැඩිවන විට නම්‍යතා සංගුණකය අඩු වෙයි.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

11. පහත සඳහන් ප්‍රකාශ අතුරින් එකඟ විය නොහැකි ප්‍රකාශය වනුයේ,
1. භාණ්ඩයක ඉල්ලුම පූර්ණ අනම්‍ය නම් පාරිභෝගික අතිරික්තය තීරණය කළ නො නොහැකියි.
2. භාණ්ඩයක ඉල්ලුම පූර්ණ නම්‍ය වේ නම් පාරිභෝගිකයා ගෙවීමට කැමති මිලත් ගෙවන මිලත් සමාන වෙයි.
3. භාණ්ඩයක ඉල්ලුම පූර්ණ නම්‍ය වේ නම් පාරිභෝගික අතිරික්තය ශූන්‍ය වෙයි.
4. භාණ්ඩයක සැපයුම පූර්ණ අනම්‍ය නම් පාරිභෝගික අතිරික්තය ශූන්‍ය වෙයි.
5. භාණ්ඩයක ඉල්ලුමට සාපේක්ෂව සැපයුම් අනම්‍ය වේ නම් පාරිභෝගික අතිරික්තය ධන අගයක් ගනියි.

(..................)

12. වෙළඳපොළ තීරණය වී ඇති සමතුලිත මිල සැපයුම්කරුවන්ට ප්‍රමාණවත් නොවේ යන තීරණය මත රජය විසින් මිල ආධාරක ප්‍රතිපත්තියක් හඳුන්වාදීම සහ අතිරික්ත සැපයුම කළමනාකරණය කිරීමේ ප්‍රතිඵල දැක්වෙන රූප සටහන් පහත පරිදි වෙයි. මෙම ප්‍රතිපත්තිය මගින් පාරිභෝගික අතිරික්තයට, නිෂ්පාදක අතිරික්තයට හා සමාජ ශුභ සාධනයට සිදුවන බලපෑම පිළිවෙලින් දැක්වෙන්නේ,



1. වැඩිවෙයි, වැඩිවෙයි, අඩුවෙයි
2. අඩුවෙයි, වැඩිවෙයි, අඩුවෙයි
3. වැඩිවෙයි, වැඩිවෙයි, අඩුවෙයි
4. වෙනස් නොවෙයි, වැඩිවෙයි, අඩුවෙයි
5. අඩු වෙයි, වැඩිවෙයි, වැඩිවෙයි

(..................)

13. එක්තරා කන්නයකදී අස්වැන්න පහළ ගිය ද ගොවීන්ගේ අළෙවි ආදායම් ඉහළ යාමක් සිදුවිය. මේ සඳහා පහත සඳහන් කවර තත්ත්වයක් බලපානු ලැබේ ද? වඩාත් නිවැරැදි පිළිතුර වනුයේ කුමක්ද?
1. වී සඳහා නම්‍ය ඉල්ලුමක් හා නම්‍ය සැපයුමක් පැවතීමයි.
2. වී සඳහා අනම්‍ය ඉල්ලුමක් හා අනමන්‍ය සැපයුමක් පැවතීමයි.
3. වී සඳහා පූර්ණ නම්‍ය ඉල්ලුමක් හා පූර්ණ අනම්‍ය සැපයුමක් පැවතීමයි.
4. වී සඳහා නම්‍ය ඉල්ලුමක් හා ඒකීය නම්‍ය සැපයුම පැවතීමයි.
5. වී සඳහා ඒකීය නම්‍ය ඉල්ලුමක් හා පූර්ණ අනම්‍ය සැපයුම පැවතීමයි. (..................)

14. ගැනුම්කරුවන් මත පැටවෙන බද්ද සම්බන්ධ පහත ප්‍රකාශවලින් එකඟවිය නොහැකි ප්‍රකාශය කුමක්ද?
1. ගැණුම්කරුවන්ගේ ඉල්ලුම් මිල බද්දෙහි ප්‍රමාණයෙන් අඩු වෙයි.
2. ගැණුම්කරුවන් මත බද්ද සැපයුම් වක්‍රයට කිසි බලපෑමක් නොකරයි.
3. බද්ද රජයට ගෙවීමට නෛතික වශයෙන් ගැණුම්කරු බැඳී සිටියි.
4. බද්දට පෙර ගැණුම්කරු ගෙවූ මිල සහ විකුණුම්කරු ලැබූ මිල සමාන වන අතර බද්දට පසු ද එය සමාන වෙයි.
5. බද්දට පසු ආර්ථික බදු ආපාතය බෙදීයාම ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාව මත වෙනස් වෙයි. (..................)

15. කෙටි කාලයේ දී ආන්තික ඵලදාව උපරිම වීමෙන් පසු නිමැවුම ප්‍රසාරණය කරන විට දැකිය හැකි ලක්ෂණ හඳුනාගන්න.

	ආන්තික ඵලදාව	සාමාන්‍ය ඵලදාව	මුළු ඵලදාව	ආන්තික පිරිවැය
1.	අඩු වේ	වැඩි වේ	වැඩි වේ	වැඩි වේ
2.	අඩු වේ	අඩු වේ	අඩු වේ	වැඩි වේ
3.	වැඩි වේ	අඩු වේ	අඩු වේ	අඩු වේ
4.	වැඩි වේ	වැඩි වේ	අඩු වේ	අඩු වේ
5.	ස්ථාවරය	අඩු වේ	වැඩි වේ	වැඩි වේ.

(..................)

16. නිෂ්පාදන ආයතනයක ආන්තික පිරිවැය ඉක්මවූ ආන්තික අයභාරය පවතින විට නිමැවුම තවදුරටත් ප්‍රසාරණය කළේ නම්,
1. අලාභය ඉහළ යනු ඇත.
2. ආර්ථික ලාභ ඉහල යනු ඇත.
3. ආන්තික පිරිවැය අඩු වනු ඇත.
4. නිෂ්පාදකයා, නිෂ්පාදන කටයුතු වලින් ඉවත් වනු ඇත.
5. ආර්ථික ලාභ ශූන්‍ය වනු ඇත. (..................)

17. මුළු පිරිවැය සහ මුළු විචල්‍ය පිරිවැය අතර පවතින සිරස් දුර
1. නිමැවුම අඩු වන විට අඩුවෙමින් පවතී
2. නිමැවුම අඩු වන විට වැඩිවෙමින් පවතී
3. ආන්තික පිරිවැයට සමාන වේ
4. මුළු ස්ථාවර පිරිවැයට සමාන වේ
5. සාමාන්‍ය ස්ථාවර පිරිවැයට සමාන වේ (..................)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

18. කෙටි කාලයේදී x භාණ්ඩය නිෂ්පාදනය කරන විට හටගන්නා ආන්තික පිරිවැය පහත සඳහන් ලේඛනයේ ඇතුළත් වේ.

x නිමැවුම් (ඒකක)	1	2	3	4	5	6	7
ආන්තික පිරිවැය	30	20	16	24	40	56	64

මුළු ස්ථාවර පිරිවැය රු 30/= නම් කෙටි කාලයේ දී සාමාන්‍ය මුළු පිරිවැය අවම වන්නේ කවර නිමැවුම් ඒකක ප්‍රමාණයයක දී ද?

1. නිමැවුම් ඒකක 2 දීය.
2. නිමැවුම් ඒකක 3 දීය.
3. නිමැවුම් ඒකක 4 දීය.
4. නිමැවුම් ඒකක 5 දීය.
5. නිමැවුම් ඒකක 6 දීය.

(..................)

19. පහත සඳහන් කටයුතු අතුරින් නිෂ්පාදන ඉම තුළට ඇතුලත් ආර්ථික කටයුත්ත කුමක්ද?
   1. පවුලේ වැඩිහිටියන් සහ රෝගීන් රැක බලා ගැනීම
   2. නිවැසියන් විසින් තම දරුවා පෞද්ගලික මෝටර් රථයෙන් පාසලට රැගෙන යාම
   3. ආහාර පිස ගැනීම හා පිළිගැන්වීම
   4. නිවසේ පදිංචි කරුවන් විසින් නිවස පිරිසිදු කර ගැනීම
   5. මෙහෙකරුවන් විසින් කෑම පිළියෙල කරගැනීම

(..................)

20. බේකරි හිමියකුගේ පාන් නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ තොරතුරු පහත දැක්වේ.

	රුපියල්
පාන් තොගය වෙළඳපොලේ වටිනාකම	10,000
තිරිඟු පිටි වියදම	1500
බටර් මිලදී ගැනීම	200
පොල්තෙල් සඳහා වියදම	150
වෙනත් අමුද්‍රව්‍ය වියදම්	50
ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජන වියදම	100

ඉහත තොරතුරු හා සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. පාන් තොගයේ දළ වටිනාකම රුපියල් 2100 ක් වේ.
2. අතරමැදි පරිභෝජනය රුපියල් 2100 ක් වේ.
3. නිමවුමේ ශුද්ධ එකතු කළ අගය රුපියල් 12000 ක් වේ.
4. නිමවුමේ දළ එකතු කළ අගය රුපියල් 8000 ක් වේ.
5. නිමවුමේ දළ වටිනාකම රුපියල් 10100 ක් වේ.

(..................)

21. එක්තරා ආර්ථිකයක පසුගිය වර්ෂයට අදාළ කල්පිත දත්ත පහත දැක්වේ. (වටිනාකම රුපියල් මිලියන වලින්)

පෞද්ගලික ඉතුරුම්	1400
මුළු රාජ්‍ය ආදායම	5400
රාජ්‍ය වර්තන වියදම	5600
කුටුම්බ ඉතිරිකිරීම්	800
දළ දේශීය නිෂ්පාදිතය (වෙළෙඳ මිල)	10,000

මෙම ආර්ථිකයේ දේශීය ඉතිරිකිරීම් අනුපාතය

1. 10%   2. 12%   3. 14%   4. 16%   5. 20%

(..................)

22. කිසියම් වර්ෂයක එක්තරා ආර්ථිකයට අදාළ කල්පිත දත්ත පහත දක්වේ. (වටිනාකම රුපියල් බිලියන)

සේවක ආදායම්	500
ශුද්ධ මෙහෙයුම් අතිරික්තය	1200
ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය	200
මිශ්‍ර ආදායම්	300
තොග හෙවත් පරිලේඛන වෙනස්වීම්	250
නිෂ්පාදන මත වෙනත් බදු - එම සහනාධාර	100
භාණ්ඩ හා සේවා මත අයකරන බදු - එම සහනාධාර	400

වෙළෙඳපොල මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන

1. 2950 කි   2. 2850 කි   3. 2700 කි   4. 2600 කි.   5. 2300 කි.

(..................)

23. කල්පිත ආර්ථිකයක රාජ්‍ය මිලදී ගැනීම් රුපියල් මිලියන 500 කින් ඉහළ යන විට මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 2000 කින් ඉහළ ගොස් ඇත. මෙම ආර්ථිකයේ ආන්තික පරිභෝජන නැමියාව.

1. 0.9 කි   2. 0.8 කි   3. 075 කි   4. 0.6 කි   5. 0.25 කි

(..................)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers   Model Answers - Study Resources

24. සරල ආර්ථික ක්‍රමයක පරිභෝජන ශ්‍රිතයේ ලක්ෂ්‍ය දෙකක් පහත දැක්වේ.

yd(රු.ද.ල.)	C (රු.ද.ල)
1000	750
2000	1350

මෙම ආර්ථිකයේ ඉතිරිකිරීම් ශ්‍රිතය

1. S=150+0.4yd
2. S=150+0.4yd
3. S=-150+0.6yd
4. S= -150+0.6yd
5. S=-1000+0.4yd (..................)

25. ආර්ථිකයක සමාහාර ඉල්ලුම් විශාලතම වැඩිවීමක් හට ගනුයේ පහත සඳහන් කවරක් හේතු කොටගෙන ද?

1. රුපියල් මිලියන 500 කින් රාජ්‍ය වියදම් ඉහළ දැමීම.
2. රුපියල් මිලියන 500 කින් බදු කපා හැරීම.
3. රුපියල් මිලියන 500 කින් සංක්‍රාම වියදම් ඉහළ දැමීම.
4. රුපියල් මිලියන 500 කින් බදු ඉහළ දැමීම සමග රුපියල් මිලියන 200 කින් රාජ්‍ය වියදම් ඉහළ දැමීම.
5. රුපියල් මිලියන 500 කින් බදු පහළ හෙළීම සමග ආයෝජන වියදම් රුපියල් මිලියන 200 කින් ඉහළ දැමීම.

(..................)

26. ආසන්න මුදලක සුවිශේෂ ලක්ෂණය වන්නේ කුමක් ද?

1. හුවමාරු මාධ්‍යයක් ලෙස ක්‍රියා කිරීම.
2. වටිනාකමේ සන්නිධියක් ලෙස ක්‍රියා කිරීම.
3. පූර්ණ ද්‍රවශීලතාවයෙන් යුක්ත වීම.
4. මහජනතාව නමින් වාණිජ බැංකුවල පවතින ඉල්ලුම් තැන්පතු ශේෂ නියෝජනය කිරීම.
5. චෙක්පත් මගින් අන්සතු කළ හැකි වීම (..................)

27. ද්‍රවශීලතාව යනු,

1. අවම පිරිවැයක් හා අවම කාලයක් තුළ වත්කම්, විනිමය මාධ්‍යයක් බවට පෙරළා ගැනීමේ හැකියාව.
2. මුදල් හා පොලී අනුපාතිකය අතර පවත්නා ප්‍රතිලෝම සම්බන්ධතාවයයි.
3. පොලී අනුපාතික වෙනසකින් තොරව මුදල් ඉල්ලුම වෙනස් වීමයි.
4. මුදල් මුදල් වශයෙන් ළඟ තබා ගැනීමට මහජනතාව දක්වන කැමැත්තයි.
5. ගනු දෙනු කිරීමේ චේතනාවෙන් සිය වත්කම් මුදල් බවට පෙරළා ගැනීමයි. (..................)

28. මුදල් සැපයුම රුපියල් මිලියන 10 ක් සහ සංසරණ ප්‍රවේගය 2 වන ආර්ථික මුදල් සැපයුම දෙගුණ වුව හොත් වෙළඳ පොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය

1. 20% කින් ඉහළ යයි
2. 40% කින් ඉහළ යයි
3. 50% කින් ඉහළ යයි
4. 100% කින් ඉහළ යයි
5. 200% කින් ඉහළ යයි (..................)

29. වාණිජ බැංකු ශේෂපත්‍රයක වත්කම් කිහිපයක් පහත දැක්වේ.

A - අතැති මුදල්
B - භාණ්ඩාගාර බැඳුම්කර
C - මහබැංකුවෙන් අයවිය යුතු ශේෂ
D - භාණ්ඩාගාර බිල්පත්
E - දේශීය බැංකුවලින් අයවිය යුතු ශේෂ
F - අතැති හා විදේශ බැංකුවලින් අයවිය යුතු විදේශ මුදල්

ඉහත වත්කම් අතුරෙන් ප්‍රාථමික සංචිත වශයෙන් සලකන දෑ අඩංගු පිළිතුරු කාණ්ඩය කුමක් ද?

1. A, B, C හා D
2. A, B, C, හා F
3. A, C, D හා E
4. A, C, D, හා F
5. A, C, E හා F (..................)

30. පහත සඳහන් කවරක් පිරිවැයෙන් තල්ලු වුණු උද්ධමනයට හේතු වේ ද?

1. මුදල් සැපයුමේ වැඩි වීමක්
2. කුටුම්භ පරිභෝජනයේ ඉහළ යාමක්
3. ශ්‍රමයේ මිල ඉහළ යාමක්
4. රජයේ මිලදී ගැනීම් පහළ බැසීමක්
5. විදුලි බලයේ මිල පහළ බැසීමක් (..................)

31. තත්කාලීන දළ පියවුම් පද්ධතිය (RTGS) යනු,

1. මුදල් වෙළෙඳපොළ මූල්‍ය ආයතනයකි.
2. ප්‍රාග්ධන වෙළෙඳපොළ මූල්‍ය ආයතනයකි.
3. මුදල් වෙළෙඳ පොළේ හුවමාරුවන උපකරණයකි.
4. මූල්‍ය යටිතල පහසුකමකි.
5. මූල්‍ය නියාමන ආයතනයකි. (..................)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

32. ධාරිතා මට්ටම උපරිමය කරා ළඟාවන තුරු පාරිභෝජනයේ තරගකාරීත්වයක් දැකිය නොහැකි එහෙත් පරිභෝජනය සීමා කළ හැකි භාණ්ඩයකට නිදසුනක් වන්නේ,
1. මුහුදු වෙරළක්
2. ජාතික ආරක්ෂාව
3. වායු ගෝලය
4. මෝටර් රථයක්
5. තෘණ භූමියක් (..................)

33. සැපයුම් පාර්ශ්වයේ ආර්ථික ප්‍රතිපත්තිවල උපකරණයක් ලෙස සෘජුවම සැළකිය නොහැක්කේ කුමක් ද?
1. බදු ප්‍රතිසංස්කරණයේ ය.
2. පෞද්ගලීකරණය
3. ප්‍රතිපත්ති පොලී අනුපාතිකය
4. නියාමනහරණය
5. ශ්‍රම වෙළෙඳ පොළ ප්‍රතිසංස්කරණය (..................)

34. පහත ඒවා අතුරින් සංක්‍රාම වියදමක් ලෙස සලකා ජාතික ගිණුම්වලට ඇතුළත් නොකෙරෙන රාජ්‍ය වියදම් ශීර්ෂය කුමක් ද?
1. සේවක වැටුප් ගෙවීම
2. පොලී ගෙවීම
3. යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම
4. පාසල් ගොඩනැගිලි ඉදි කිරීම
5. ශුද්ධ ණය දීම (..................)

35. මෑත වර්ෂවලදී ශ්‍රී ලංකාවේ දේශීය රාජ්‍ය ණය වැඩි ප්‍රමාණයක් ලබා ගැනීමට භාවිතා කළ මූලාශ්‍රය වී ඇත්තේ,
1. මහ බැංකු අත්තිකාරම්ය
2. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරය
3. භාණ්ඩාගාර බිල්පත්ය.
4. භාණ්ඩාගාර බැඳුම්කරය
5. රුපියල් සුරැකුම්පත්ය. (..................)

36. 2017 වසරේ මුළු රාජ්‍ය ණය හා සමස්ත අය වැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස නිවැරදිව දැක්වෙන සංයෝජනය කුමක් ද?

	මුළු රාජ්‍ය ණය (ද.දේ.නි ප්‍රතිශතයක් ලෙස)	සමස්ත අය වැය හිඟය (ද.දේ.නි ප්‍රතිශතයක් ලෙස)
1.	70.8	0.0
2.	71.3	-0.7
3.	77.6	-5.5
4.	77.7	-5.7
5.	78.8	-7.6

(..................)

37. යම් ආර්ථික ක්‍රියාවලියක බාහිරතා එහි පෞද්ගලික පිරිවැයට හා පෞද්ගලික ප්‍රතිලාභවලට ගැලපූ පසු, සමාජය සම්බන්ධයෙන් ප්‍රශස්ත නිමැවුම එහි වෙළඳපොළ නිමැවුම් මට්ටමට සමපාත වන්නේ,
1. නිෂ්පාදනයේ බාහිර පිරිවැය, පරිභෝජනයේ බාහිර පිරිවැයට සමාන වන විටය.
2. නිෂ්පාදනයේ බාහිර ප්‍රතිලාභ, පාරිභෝජනයේ බාහිර ප්‍රතිලාභවලට සමාන වන විටය.
3. නිෂ්පාදනයේ බාහිර පිරිවැය, පරිභෝජනයේ බාහිර ප්‍රතිලාභ ඉක්මවා යන විට ය.
4. නිෂ්පාදනයේ බාහිර ප්‍රතිලාභ, පරිභෝජනයේ බාහිර පිරිවැයට සමාන වන විට ය.
5. නිෂ්පාදනයේ බාහිර ප්‍රතිලාභ, පරිභෝජනයේ බාහිර පිරිවැය ඉක්මවා යන විටය. (..................)

38. විවෘත ආර්ථිකයක දේශීයව නිපදවන ලද සහ ආනයනය කරන ලද කමිසයක මිල රුපියල් 2000 කි. දේශීයව කමිස නිෂ්පාදනයේදී ආනයන යෙදවුම් 60% භාවිත කරයි. දේශීය කමිස කර්මාන්තය ආරක්ෂා කිරීම සඳහා ආනයන කමිස මත 20% ක තීරුබද්දක් රජය පනවන අතර ආනයන යෙදවුම් සඳහා ද 10% ක තීරු බද්දක් රජය පනවනු ඇත. තීරුබද්දේ සාඵල්‍ය ආරක්ෂණ අනුපාතය,

සාඵල්‍ය ආරක්ෂණ අනුපාතය

	යෙදවුම් සඳහා තීරු බදු පැනවීමට පෙර	යෙදවුම් සඳහා තීරු බදු පැනවීම යටතේ
1.	30%	75%
2.	35%	60%
3.	40%	45%
4.	50%	35%
5.	80%	20%

(..................)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

39. රටක කිසියම් වර්ෂයක අපනයන මිල දර්ශකය 150% කින් ඉහළ ගොස් ඇති අතර ආනයන මිල දර්ශකය 125% කින් ඉහළ යන ලදී. මෙම ආර්ථිකය විදේශ වෙළඳ අනුපාතයයි.

1. 150 කි　　2. 120 කි
3. 111.1 කි　　4. 90 කි.
5. 83.33 කි　　(..................)

40. එක්තරා ආර්ථිකයකට අදාළ විදේශ වත්කම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

අයිතමය	2017	2018
රජයේ විදේශ වත්කම්	500	600
මහබැංකුවේ විදේශ වත්කම්	1000	1200
තැන්පතු බාරගන්නා ආයතනවල විදේශ වත්කම්	2000	2500
සංචිතවලට අදාළ වගකීම්	400	600

ඉහත දත්තවලට අනුව මෙම ආර්ථිකයේ 2018 වර්ෂයේ ගෙවුම් ශේෂ ගිණුමේ සමස්ත ශේෂය කොපමණ ද?

1. - 100　　2. -200
3. 1200　　4. 2100
5. 3700　　(..................)

41. විනිමය අනුපාතිකයේ ක්ෂය වීමක් / අවප්‍රමාණය කිරීමක් වෙළෙඳ ශේෂය කෙරෙහි යහපත් බලපෑමක් ඇති කිරීමට පහත සඳහන් කුමන කොන්දේසියක් වඩාත් සාර්ථක වන්නෙහි ද?

	අපනයන මිල ඉල්ලුම් නම්‍යතාවය	ආනයන මිල ඉල්ලුම් නම්‍යතාව	අපනයන සැපයුම නම්‍යතාව
1.	-0.2	-0.4	0.5
2.	-0.25	-0.5	0.7
3.	-2.5	-1.6	0.4
4.	-2.5	-1.6	1.7
5.	-0.4	-1.2	1.0

(..................)

42. රුපියලේ අගය තීරණය වන විදේශ විනිමය වෙළෙඳ පොළෙහි හුවමාරු වන්නේ ඩොලර් සහ රුපියල ය. මෙහි ඉල්ලුම් වක්‍රයෙන් පෙන්නුම් කරනුයේ රුපියලට කරන ඉල්ලුම වේ. එය තීරණය වන්නේ පහත සඳහන් කවර කරුණක් මත ද?

1. ශ්‍රී ලංකාවේ අපනයන මිලදී ගන්නන් තුළින් ය.
2. ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධනය පිටතට ගලා යාම තුළින්ය.
3. ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කිරීම තුළින්ය.
4. ශ්‍රී ලාංකිකයින් ඇමරිකාවේ සංචාරය කිරීම තුළින් ය.
5. විදේශ රටවල අධ්‍යාපනය ලබන ශ්‍රී ලාංකික සිසුන් තුළින්ය.

(..................)

43. කිසියම් රටක නාමික විනිමය අනුපාතිකය ක්‍රයශක්ති සාම්‍ය විනිමය අනුපාතිකයට සාපේක්ෂව අධිතක්සේරු වී පවතී නම්

1. වෙළෙඳ ශේෂයේ අතිරික්තයක් ඇති වේ.
2. වෙළෙඳ ශේෂයට කිසිදු බලපෑමක් ඇති නොවේ.
3. වෙළෙඳ ශේෂයේ හිඟයක් ඇති වේ.
4. වෙළෙඳ ශේෂයේ අතිරික්තයක් සහ ජංගම ගිණුමේ අතිරික්තයක් ඇති වේ.
5. වෙළෙඳ ශේෂයේ අතිරික්තයක් හෝ හිඟයක් ඇති වේ.　　(..................)

44. ගෙවුම් ශේෂය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. වෙළෙඳ ශේෂය සහ මූල්‍ය ගිණුම් එකතුව ප්‍රාග්ධන ගිණුම් ශේෂයට සමාන විය යුතුය.
2. ප්‍රාග්ධන ගිණුමේ සහ ජංගම ගිණුමේ එකතුව වෙළෙඳ ශේෂයට සමාන විය යුතුය.
3. ශුද්ධ අපනයන සහ ප්‍රාග්ධන ගිණුමේ එකතුව මූල්‍ය ගිණුමේ ශේෂයට සමාන විය යුතුය.
4. වර්තන ගිණුමේ සහ මූල්‍ය ගිණුමේ එකතුය ප්‍රාග්ධන ගිණුමේ ශුද්ධ ශේෂයට සමාන විය යුතුය.
5. ජංගම ගිණුමේ සහ ප්‍රාග්ධන ගිණුමේ එකතුව මූල්‍ය ගිණුමේ ශුද්ධ ශේෂයට සමාන විය යුතුය.　　(..................)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers　Model Answers - Study Resources
iexamhub

45. ආදායම් විෂමතාව මැනීම සඳහා යොදා ගත හැකි මිණුම වන්නේ,
1. ලෝරන්ස් වක්‍රය
2. ඒකපුද්ගල ආදායම
3. ආර්ථික වර්ධන අනුපාත
4. ශ්‍රම ශක්ති සාමාජ්‍ය දළ ජාතික ආදායම
5. බහුමාන දරිද්‍රතා දර්ශකය (..................)

46. කිසියම් රටක ප්‍රජාවිද්‍යාත්මක දත්ත කිහිපයක් පහත දැක්වේ. (සියලු දත්ත මිලියනවලිනි)

ජනගහනය	60
වැඩකළ හැකි වයසේ ජනගහනය	50
සේවා නියුක්ති සංඛ්‍යාව	28
සේවා වියුක්ති සංඛ්‍යාව	2

ඉහත දත්ත අනුව ආර්ථිකයේ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය
1. 40% 2. 56%
3. 60% 4. 75%
5. 43% (..................)

47. 2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙහි ආංශික සංයුතිය හඳුනා ගන්න.

	කෘෂි අංශය %	කර්මාන්ත අංශය%	සේවා අංශය %
1.	6	26	56
2.	7	27	56
3.	8	25	54
4.	7	27	57
5.	6	26	57

48. තිරසාර සංවර්ධනයේ පැතිකඩ තුන නිවැරදි දැක්වෙන වරණය තෝරන්න.
1. ආර්ථික සංවර්ධනය, සමාජ සංවර්ධනය, සංස්කෘතික සංවර්ධනය
2. ආර්ථික සංවර්ධනය, පරිසර සංරක්ෂණය, ආර්ථික නිදහස
3. ආර්ථික සංවර්ධනය, සමාජ සංවර්ධනය, පරිසර සංරක්ෂණය
4. ආර්ථික සංවර්ධනය, දේශපාලන නිදහස, සංස්කෘතික සංවර්ධනය
5. ආර්ථික වෘද්ධිය සමාජ සාධාරණත්වය, පාරිසරික සංවර්ධනය (..................)

49. මෑත කාලීන ශ්‍රී ලංකා ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතයේ හා සේවා නියුක්තියේ ව්‍යුහමය වෙනසක් ලෙස දැකිය නොහැකි තත්ත්වයක් වනුයේ,
1. කාෂිකාර්මික නිෂ්පාදිතයේ ප්‍රතිශත වැදගත්කම අඩුවීම
2. කාර්මික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක වැදගත්කම වැඩිවීම
3. සේවා නිෂ්පාදිතයේ ප්‍රතිශතය වැදගත්කම වැඩිවීම
4. කෘෂි අංශයේ සේවා නියුක්තිය ප්‍රතිශතය අඩුවීම
5. කාර්මික අංශයේ සේවා නියුක්ති ප්‍රතිශතය අඩුවීම (..................)

50. 2017 වර්ෂයේ මුළු විදේශ විනිමය ඉපයීම්වල දායකත්වයෙන් තුන්වන ස්ථානයට පත්ව ඇත්තේ,
1. විදේශ ප්‍රේරණ
2. රෙදිපිළි හා ඇඟළුම්
3. සංචාරක කර්මාන්තය
4. ඛනිජ තෙල් නිෂ්පාදනය
5. සම්භාණ්ඩ ප්‍රවාහනය හා පාවහන් උපකරණ (..................)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Educa-

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 13 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණ, 2019
General Certificate of Education (Adv. Level), Grade 13, Year End Test, July 2019

ආර්ථික විද්‍යාව II
Economics - II

21 S II

පැය 03 යි
Three hours
අමතර කියවීම විනාඩි 10යි

විභාග අංකය:...

උපදෙස්: * 'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

'අ'කොටස

1. (i) ''ස්වභාවික සම්පත්'' සංකල්පය අර්ථකථනය කර එහි වර්ගීකරණය උදාහරණ සහිතව දක්වන්න.(ලකුණු 4)

(ii) ප්‍රාග්ධනයේ විවිධ ස්වරූප කවරේ ද? ඒවා අතුරෙන් සමාජ ශුභ සාධනය ඉටුකිරීමට කවරක් දායක වේ ද? (ලකුණු 4)

(iii) ආර්ථික පද්ධතීන්හී විවිධත්වයට බලපාන සාධක කවරේ ද? (ලකුණු 4)

(iv) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක ආන්තික ආවස්ථික පිරිවැය හැසිරෙන ආකාරය අනුව එහි ස්වරූප කවරේද? ඉන් වඩාත් තාත්වික ස්වරූපය පැහැදිලි කරන්න. (ලකුණු 4)

(v) නිෂ්පාදන කාර්යක්ෂමතාව තුළින් පමණක් ආර්ථික කාර්යක්ෂමතාව අත්කර ගත නොහැක. විමසන්න. (ලකුණු 4)

2. (අ) (i) පෞද්ගලික (ආයතනයක) සැපයුම් වක්‍රය හා වෙළඳ සැපයුම් වක්‍රය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ii) සලකා බලන භාණ්ඩය බාල භාණ්ඩයක් නම් මිල වැඩිවීමක ආදායම් ප්‍රතිවිපාකය හා ආදේශන ප්‍රතිවිපාකය පැහැදිලි කරන්න. (ලකුණු 3)

(iii) පහත සඳහන් භාණ්ඩ හඳුනා ගන්න.
(අ) x හා y භාණ්ඩ අතර හරස් ඉල්ලුම් නම්‍යතාව සෘණ අගයක් ගැනීම
(ආ) y භාණ්ඩයේ ආදායම ඉල්ලුම් නම්‍යතාව සෘණ අගයක් ගැනීම.
(ඉ) z භාණ්ඩයේ ආදායම් ඉල්ලුම් නම්‍යතාව 0.6ක අගයක් ගැනීම (ලකුණු 3)

(iv) තරගකාරී වෙළඳපොළක අලෙවි වන එක්තරා භාණ්ඩයක් සඳහා මිල ඉල්ලුම් හා සැපයුම් ප්‍රමාණයන් පහතින් දැක්වෙයි. (මිල රුපියල්වලින්)

මිල රු	ඉල්ලුම් ප්‍රමාණය	සැපයුම් ප්‍රමාණය
4	10	2
6	8	4

(ආ) (i) සමතුලිත මිල හා ප්‍රමාණය වීජ ගණිතමය ලෙස ගණනය කොට සමතුලිත මිලේ දී නිෂ්පාදන අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 4)

(ii) තරගකාරී වෙළඳපොලක භාණ්ඩයක මිල රු 5 දී අධි ඉල්ලුම 450 ක් වන අතර මිල රු 15 දී අධි සැපයුම 300 කි. සමතුලිත මිල ප්‍රස්තාර රූප සටහනක දක්වන්න. (ලකුණු 4)

(iii) පහත දැක්වෙන්නේ එක්තරා භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් සමීකරණයන් ය.
$Qd=90-0.2p \quad Qs=-85+0.5p$
සෑම මිලකදීම ඉල්ලුම් හා සැපයුම් ප්‍රමාණ ඒකක 10 බැගින් අඩු වී නම් සමතුලිත මිල සහ එම මිලේදී පාරිභෝගික අතිරික්තය ගණන් බලන්න. (ලකුණු 4)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

3. (අ) කිසියම් භාණ්ඩ වෙළඳපොළක ඉල්ලුම් හා සැපයුම් වක්‍ර සරළ රේඛීය වේ. එම භාණ්ඩයේ පහත තොරතුරු ඔබට දක්වා ඇත.

මිළ රු	අධි ඉල්ලුම ප්‍රමාණය	ඉල්ලුම් ප්‍රමාණය
10	400	400
35	-100	150

(i) ඉල්ලුම් හා සැපයුම් වක්‍ර ප්‍රස්තාරගත කොට සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණයන් දක්වන්න. (ලකුණු 3)

(ii) ඉහත භාණ්ඩයෙහි වෙළඳපොළ අලෙවි කරණ සෑම ඒකකයකට ම රු 10 ක් සහනාධාරයක් දෙන්නේ නම් සමතුලිත මිල හා ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 4)

(iii) සහනාධාරයට පසු නිෂ්පාදන අතිරික්තය කොපමණ ද? (ලකුණු 2)

(iv) සහනාධාරයේ ශුභ සාධන ප්‍රතිවිපාකය කොපමණ ද? (ලකුණු 2)

(ආ) කිසියම් භාණ්ඩයක් සම්බන්ධ වෙළඳපොල ඉල්ලුම් සැපයුම් තත්වයන්ට අදාළ මිල සමීකරණයන් (ප්‍රතිලෝම) පහත දක්වේ.

$P_D = 170 - 2Q$ $\quad Ps = 20 + 3Q$ (මිල රුපියල් වලින්)

(i) සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 2)

(ii) සමතුලිත මිලට අදාළ පාරිභෝගික පැහැදම කොපමණ ද? (ලකුණු 2)

(ඉ) x භාණ්ඩය සම්බන්ධ වෙළඳ පොළ ඉල්ලුම සැපයුම් තත්වයන්ට අදාළ සමීකරණයක් පහත දක්වේ.

$Qd = 100 - 3P \quad Qs = 40 + 2P$

(i) ඉහත භාණ්ඩයෙහි ආනයන මිල මත 25% තීරුබද්දක් සහිතව රුපියල් 10 මිලට ආනයනය කරයි නම් වෙළඳපල සමතුලිත ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 2)

(ii) තීරුබද්ද ඉවත් කිරීමට රජය පියවර ගත හොත් රජයට අහිමිවන තිරුබදු ආදායම කොපමණද? (ලකුණු 3)

4. (i) පහත දැක්වෙන ප්‍රකාශවලට එකඟ විය හැකි ද? නොහැකි ද? යන්න දක්වා ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

(අ) කෙටි කාලයකදී නිමැවුම ප්‍රසාරණය කරන විට සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය සහ සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය අතර පරතරය ක්‍රමයෙන් වැඩි වේ.

(ආ) පරිමාණානුකූල පිරිමැසුම් හටගන්නා විට දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය පහළට ගමන් කරයි.

(ඇ) කෙටි කාලයේදී මුළු ඵලදාව උපරිම වන විට ආන්තික ඵලදාව පහත වැටේ.

(ඉ) කෙටි කාලයේදී විචල්‍ය යෙදවුම් වැඩි වේගයෙන් ඉහළ යන විට ආන්තික පිරිවැය වක්‍රය වැඩි වේගයෙන් ඉහළ නගී. (ලකුණු 2 x 4)

(ii) පහත දක්වෙන්නේ පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයකට අදාළ ඉල්ලුම් වක්‍ර හා පිරිවැය වක්‍රයන් ය.



(අ) වෙළඳපොල මිල රු 80ක් වේ නම් නිෂ්පාදකයා ආයතනය වසා දැමීමට කටයුතු කරන්නේ ද? පැහැදිලි කරන්න.

(ආ) මිල රු 100 වන විට නිෂ්පාදකයා ලබන ලාභය කොපමණ ද? (ලකුණු 2)

(ඇ) මිල රු 100 දී ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය කොපමණ ද? (ලකුණු 1)

(iii) පූර්ණ තරගකාරී වෙළඳ පොළක් ඒකාකාරී තරග වෙළඳපොලත් අතර දැකිය හැකි වෙනස්කම් මොනවා ද? (ලකුණු 4)

(iv) නිෂ්පාදන සාධකයක සැපයුම් අනම්‍යතාව වැඩිවන විට සංග්‍රාම ඉපයුම් හා ආර්ථික බදු කුලිය කෙරෙහි ඇති කරන බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 3)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

5. (i) ජාතික ගිණුම්වල ඇතුළත් ප්‍රාථමික ආදායම් (Primer income) සංකල්පය පැහැදිලි කර එහි ප්‍රධාන සංරචක හඳුන්වන්න. (ලකුණු 4)

(ii) කිසියම් ආර්ථිකයක එක්තරා වර්ෂයකට අදාළ කල්පිත සාර්ව ආර්ථික දත්ත පහත දැක්වේ. වටිනාකම (රුපියල් බිලියනවලිනි)

කුටුම්බ අවසාන පාරිභෝජන වියදම	=	6000
භාණ්ඩ සහ සේවා අපනයන වටිනාකම	=	1200
දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය	=	3500
ආණ්ඩුවේ අවසන් පරිභෝජන වියදම	=	4000
තොග හෙවත් පරිලේඛණ වෙනස්වීම්	=	1000
භාණ්ඩ හා සේවා ආනයන	=	2400
ලාභ අපේක්ෂාවෙන් තොරව කුටුම්බවෙත සේවා සපයන ආයතනික ඒකකයන්ගේ අවසන් පරිභෝජන වියදම	=	500
වටිනා දෑ අත්පත් කරගැනීම් සහ අත්හැරීම්	=	200
ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජන වියදම්	=	100
නිෂ්පාදිතය මත පනවන බදු - සහනාධාර	=	600
විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම්	=	-700
රජයේ සමූහ පරිභෝජන වියදම	=	2400
විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම	=	1700

පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) වෙළඳ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය (ලකුණු 3)

(ආ) දළ ජාතික ආදායම (ලකුණු 1)

(ඉ) වැය කළ හැකි දළ ජාතික ආදායම (ලකුණු 1)

(ඊ) සත්‍ය සුනිශ්චිත පෞද්ගලික පරිභෝජන වියදම (ලකුණු 1)

(උ) මූලික මිල යටතේ සමස්ත එකතු කළ අගය (ලකුණු 1)

(ඌ) දළ ජාතික ඉතුරුම් (ලකුණු 1)

(iii) ආර්ථිකයක සිදුවන ඉතුරුම් සහ ආයෝජනයේ හට ගන්නා වෙනස්කම් සමස්ත නිමවුම් මට්ටම කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iv) කිසියම් කල්පිත ආර්ථිකයක ජාතික ගිණුම් සම්බන්ධ තොරතුරු පහත දැක්වේ. (වටිනාකම රුපියල් මිලියන)

ආන්තික පරිභෝජන නැමියාව	=	0.8yd
ආයෝජන වියදම	=	250
ස්වාධීන පරිභෝජන වියදම	=	100
රාජ්‍ය මිල දී ගැනීම්	=	400
රාජ්‍ය බදු ආදායම	=	300
සංක්‍රාම වියදම්	=	100
ආනයන	=	400
අපනයන	=	150

(අ) මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 3)

(ආ) රාජ්‍ය බදු ආදායම රුපියල් මිලියන 200 කින් කපා හැරියහොත් නව සමතුලිත ජාතික ආදායම කොපමණ වේ ද? (ලකුණු 1)

"ආ" කොටස

6. (i) මුදල් යනු මොනවා ද? හොඳ මුදලක තිබිය යුතු ගුණාංග මොනවා ද? (ලකුණු 4)

(ii) දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනය යනු කුමක් ද? ඒ ඇසුරින් උද්ධමනය මිණුම් කරන්නේ කෙසේ ද? (ලකුණු 4)

(iii) "වාණිජ බැංකුවක් ගැටෙනසුලු අරමුණු දෙකකට මුහුණ දේ" එම අරමුණු දෙක නම් කොට ඒවා එකිනෙක ගැටෙන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iv) එක්තරා වාණිජ බැංකුවක පවතින මූල්‍ය තත්ත්ව ප්‍රකාශයක් මතු දැක්වේ.

වගකීම් (රු මිලියන)		වත්කම් (රු මිලියන)	
තැන්පතු	10000	සංචිත	6000
		ණය	4000
මුළු වගකීම්	10000	මුළු වත්කම්	10000

මෙම වාණිජ බැංකුවේ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 20% ක් නම් මෙම බැංකුවට ලබාදිය හැකි අලුත් ණය ප්‍රමාණය කොපමණ ද? බැංකු පද්ධතියට මැවිය හැකි උපරිම ණය ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 4)

(v) පහත සංකල්ප අතර වෙනස පැහැදිලි කරන්න.

(අ) පදනම් මුදල් හා මුදල් ගුණකය

(ආ) මුදල් වෙළඳපොල හා ප්‍රාග්ධන වෙළඳපොල (ලකුණු 4)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

7. (i) වෙළඳ පොළ ක්‍රමයක දක්නට ලැබෙන ''අපූර්ණ තොරතුරු'' යන සංකල්පයෙන් කුමක් අදහස් වේ ද? එය වෙළඳ පොල අසමත්වීමට තුඩු දෙන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) ''පොදු භාණ්ඩ'' හා ''පොදු සම්පත්'' යනු සමාන අරුත දෙන සංකල්ප දෙකකි. මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යන්නෙන් කවරක් අදහස් වේ ද? (ලකුණු 2)

(iv) රාජ්‍ය අයවැය ලේඛනයට අදාළ කල්පිත දත්ත සමහරක් මතු දැක්වේ.

	රුපියල් මිලියනවලිනි
පුනරාවර්තන වියදම	175000
බදු ආදායම	150000
විදේශීය ප්‍රදාන	5000
ප්‍රාග්ධන වියදම හා ශුද්ධ ණයදීම	25000
රාජ්‍ය ණය සඳහා පොලී ගෙවීම්	21000
ණය වාරික ආපසු ගෙවීම්	6000
බදු නොවන ආදායම	15000

අදාළ දත්ත පමණක් තෝරාගෙන පහත දේ ගණනය කරන්න.

(අ) වර්තන ගිණුමේ ශේෂය (ලකුණු 2)

(ආ) සමස්ත ගිණුමේ ශේෂය (ලකුණු 2)

(ඉ) ප්‍රාථමික ගිණුමේ ශේෂය (ලකුණු 2)

(v) 2000 වසරේ රුපියල් මිලියන 1,218,700 ක් වූ මුළු රාජ්‍ය ණය ප්‍රමාණය 2017 වසරේදී රුපියල් මිලියන 10, 313, 045 ක් පමණ විය. මෙලෙස රාජ්‍ය ණය ඉහළයාමක ආර්ථික ප්‍රතිවිපාක කවරේ ද? (ලකුණු 4)

8. (i) ජපානය කොරියාව යන රටවල් දෙක පරිගණක යන්ත්‍ර සහ රූපවාහිනී යන්ත්‍ර නිෂ්පාදනය සිදු කරයි. එක් එක් රටෙහි පරිගණක යන්ත්‍රයක් සහ රූපවාහිනී යන්ත්‍රයක් නිපදවීමට වැයවන ශ්‍රම ප්‍රමාණය පහත වගුවේ දැක්වේ.

රට	රූපවාහිනී යන්ත්‍රයක් නිපදවීමට වැයවන ශ්‍රම ප්‍රමාණය (ශ්‍රම පැය)	පරිගණක යන්ත්‍රයක් නිපදවීමට වැයවන ශ්‍රම ප්‍රමාණය (ශ්‍රම පැය)
කොරියාව	8	16
එක්සත් ජනපදය	12	48

(අ) එක් එක් භාණ්ඩය නිෂ්පාදනය කිරීමේලා නිරපේක්ෂ වාසි පවතින රට තෝරන්න (ලකුණු 1)

(ආ) එක් එක් භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ලා සාපේක්ෂ වාසි පවතින රට නම් කරන්න. (ලකුණු 2)

(ඉ) රටවල් දෙක අතර බාහිර වෙළඳාමක් ගොඩනගන්නේ නම් බාහිර හුවමාරු අනුපාතය ගණනය කරන්න. (ලකුණු 1)

(ii) නිදහස් වෙළඳාමට සීමාවක් ඇති කෙරෙන රටවල් විසින් අනුගමනය කරනු ලබන තීරුබදු නොවන වෙළඳ බාධක කවරේ ද? (ලකුණු 4)

(iii) බහු පාර්ශ්වීය වෙළඳ සංවිධානයක් (Multi tastera trade organisations) යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iv) 2018 වර්ෂය අවසන් වන විට ශ්‍රී ලංකාව දැනට ක්‍රියාත්මකව පවතින ද්විපාශ්වික සහ බහු පාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 4)

(v) ද්විත්ව සටහන් මූලධර්මය යොදා ගනිමින් පහත සඳහන් ගනුදෙනු ගෙවුම් තුලන ලේඛනයක වාර්තා කරනුයේ කෙසේද?

(අ) දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදි කිරීම සඳහා ජපන් රජයෙන් ලබා ගත් ණය මුදලක් වෙනුවෙන් ඩොලර් බිලියන 12000 ක් වූ ණය පොලී ප්‍රමාණයක් ගෙවීම.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(ආ) ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අදාළ වර්ෂයේ ජාත්‍යන්තර මූල්‍ය ආයතනයකින් රුපියල් මිලියන 20,000 ක ණය මුදලක් ලබා ගැනීම. (ලකුණු 1 x 2)

(iv) ගෙවුම් ශේෂ ලේඛණයේ සමස්ත ගිණුම් හිඟයක් දිගු කාලීනව පවතින්නේ නම් ඒ සඳහා ගත හැකි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කවරේ ද? (ලකුණු 4)

9. (i) ආර්ථික වර්ධනය හා සංවර්ධනය යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) ආර්ථික වෘද්ධිය ඉහළ නැංවීමට කටයුතු කිරීමේදී ශ්‍රී ලංකාව මුහුණ පාන ප්‍රධාන අභියෝග මොනවා ද? (ලකුණු 4)

(iii) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයේ ප්‍රමාණය හා ස්වභාවය පිළිබඳව මෑත කාලීන ප්‍රවණතා මොනවා ද? (ලකුණු 4)

(iv) 'ජාතික දරිද්‍රතා ඉම' හා 'පංචම අපකිරණ අනුපාතය' යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 4)

(v) මානව සංවර්ධන දර්ශකය යොදා ගනිමින් දකුණු ආසියානු කලාපය තුළ ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන මට්ටම පැහැදිලි කරන්න. (ලකුණු 4)

10. (i) 1977 න් පසු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කළ අපනයන අභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති ඉලක්ක කවරේ ද? (ලකුණු 4)

(ii) විදේශ සේවා නියුක්තියේ මෑත කාලීන ප්‍රවණතා කවරේ ද? (ලකුණු 4)

(iii) ආර්ථික හා සමාජීය වශයෙන් යටිතල පහසුකම් වැදගත් වීමට බලපාන හේතු කවරේ ද? (ලකුණු 4)

(iv) ආර්ථිකයේ විවිධ අංශ කෙරෙහි ඍජුවම හෝ වක්‍ර ලෙස බලපෑම් කරන දේශීය හා ගෝලීය සිදුවීම් නිදසුන් මගින් දක්වන්න.

(v) 2000 වසරේ හඳුන්වා දුන් සහස්‍ර සංවර්ධන අභිමතාර්ථයන්ට අනුප්‍රාප්තික අභිමතාර්ථ ලෙස හිතකර සංවර්ධන අභිමතාර්ථ 17 ක් 2015 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් එළි දක්වා ඇත. තිරසාර සංවර්ධන අභිමතාර්ථ කෙරෙහි අවවධානය යොමු වී ඇති පුළුල් ක්ෂේත්‍ර 05 කවරේ ද? (ලකුණු 4)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Answer

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 13 ශ්‍රේණිය, තුන්වන වාර පරීක්ෂණ, 2019 ජූලි
General Certificate of Education (Adv. Level), Grade 13, Third Term Test, July 2019

ආර්ථික විද්‍යාව
පිළිතුරු පත්‍රය

21 | S | I -II

විභාග අංකයඃ...

I - පත්‍රය

1. - 2	2. - 3	3. - 3	4. - 5	5. - 2	6. - 3	7. - 3
8. - 4	9. - 5	10. - 1	11. - 4	12. - 1	13. - 2	14. - 4
15. - 1	16. - 2	17. - 4	18. - 3	19. - 5	20. - 4	21. - 2
22. - 3	23. - 3	24. - 1	25. - 5	26. - 2	27. - 4	28. - 4
29. - 5	30. - 3	31. - 4	32. - 1	33. - 3	34. - 2	35. - 4
36. - 3	37. - 4	38. - 4	39. - 3	40. - 1	41. - 4	42 - 1
43. - 3	44. - 5	45. - 1	46. - 3	47. - 4	48. - 3	49 - 5
50 - 3						

II - පත්‍රය

1. i. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සම්පත් ස්වභාවික සම්පත් වේ.
උදාඃ- හිරු එළිය, වාතය, වැසි ජලය (ල.2)
ස්වභාවික සම්පත් වර්ග දෙකකි. 1. ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත්
උදාඃ- වන සම්පත, මත්ස්‍ය සම්පත (ල.1)
2. ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත්
උදාඃ- මිනිරන්, ගෑස්, රත්‍රන් (ල.1)

ii. ප්‍රභේදඃ- ස්ථාවර / මූර්ත / භෞතික ප්‍රාග්ධනය
කාරක ප්‍රාග්ධනය / සංසරණ ප්‍රාග්ධනය / තොග / පරිලේඛණ
ආර්ථික, පොදු කාර්ය ප්‍රාග්ධනය
සමාජ පොදු කාර්ය ප්‍රාග්ධනය
මානව ප්‍රාග්ධනය
ස්වභාවික ප්‍රාග්ධනය
සමාජ ප්‍රාග්ධනය (ඕනෑම කරුණු 4 කට ලකුණු 2)

- මූලික මිනිස් අවශ්‍යතාවන් සපුරාලීමට යොදා ගනු ලබන සේවාවන් සම්පාදනය කරන ප්‍රාග්ධන භාණ්ඩ සමාජ පොදු කාර්යය ප්‍රාග්ධනය වේ. උදාඃ අධ්‍යාපනය සෞඛ්‍ය, පානීය ජලය සම්පාදනය මේවා මඟින් සමාජ ශුභ සාධනය ඉටුවේ. (ලකුණු 1)
- සමාජ අන්තර් සම්බන්ධතා, සම්බන්ධතා ජාලයක් වැනි සමාජ ප්‍රාග්ධනය මෙහිලා ඍජුව හෝ වක්‍රව සමාජ ශුභසාධනයට දායක වේ. (ලකුණු 1)

iii. තීරණ සම්බන්ධීකරණ යන්ත්‍රය හෙවත් සම්පත් බෙදා වෙන් කිරීමේ යන්ත්‍රය
- සම්පත් හිමිකාරීත්වයේ ස්වරූපය
- සානුබලවල ස්වභාවය
- ආදායම් පුනර් ව්‍යාප්තිය සහ සමාජ ආරක්ෂක ජාලවල ස්වරූපය
- දේශපාලන දර්ශනය හා දෘෂ්ටිවාද (සියල්ලම තිබේ නම් (ලකුණු 4)

iv. ස්ථාවර ආවස්ථික පිරිවැය
වැඩෙන ආවස්ථික පිරිවැය (ලකුණු 1)
- වැඩෙන ආවස්ථික පිරිවැයඃ-
නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත ගමන් කිරීමේදී කිසියම් නිශ්චිත ප්‍රමානය බැගින් වැඩි කිරීමේදි අනෙක් භාණ්ඩයෙන් කැප කරන ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වන තත්ත්වය වැඩෙන ආවස්ථික පිරිවැය (ලකුණු 2)
මෙය වඩාත් තාත්වික තාත්වික බබව පෙන්නුම් කරයි
- සම්පත් සමජාතීය නොවීම
- එක් නිෂ්පාදන කාර්යක්ෂම සම්පත් අනෙක් නිෂ්පාදනයට කාර්යක්ෂම නොවීම (ලකුණු 1)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

v. i. ආර්ථික කාර්යක්ෂමතාව යනු නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව හා සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව යන දෙකෙහිම එකතුවයි. (ලකුණු 1)

නිෂ්පාදන කාර්යක්ෂමතාව යනු සියලු සම්පත්වලින් වැඩි ම ඵලදාවයි. එය නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර මත පිහිටි ලක්ෂ්‍යයන් මගින් පෙන්වයි. (ලකුණු 1)

නමුත් ආර්ථික කාර්යක්ෂමතාව ඉටුවීමට සම්පත් බෙදී යාමේ කාර්යක්ෂමතාව ද ඉටු විය යුතුය. එනම් MC=MB=P මෙය නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ එක් ලක්ෂ්‍යයකදී පෙන්නුම් කරයි. (ලකුණු 1)

මේ නිසා ආර්ථික කාර්යක්ෂමතාවය අත්කර ගැනීමට නිෂ්පාදන කාර්යක්ෂමතාවයද සම්පත් බෙදා හැරීමේ කාර්යක්ෂමතාවයද ඉටු විය යුතුයි (ලකුණු 1)

2. (අ) i. යම් නිෂ්පාදකයකු (ආයතනයක්) යම් නිශ්චිත අවස්ථාවක (දෙන ලද අවස්ථාවක) අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී කිසියම් භාණ්ඩයක විවිධ මිල ගණන් යටතේ සැපයුම් කිරීමට සැලසුම් කළ විවිධ ප්‍රමාණයන් දක්වෙන ජ්‍යාමිතික රේඛාවකි. (ලකුණු 1)

වෙළඳපොල සැපයුම් වක්‍රය (කර්මාන්තයේ සැපයුම් වක්‍රය) යනු යම් නිශ්චිත අවස්ථාවක අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී කිසියම් භාණ්ඩයක විවිධ මිල ගණන් යටතේ වෙළඳපොලෙහි සියලුම සැපයුම්කරුවන් (ආයතන) සැපයුම් කිරීමට සැලසුම් කළ විවිධ ප්‍රමාණයන් දක්වෙන ජ්‍යාමිතික රේඛාවකි. (ලකුණු 1)

විකල්ප පිළිතුර

ආයතනික (පෞද්ගලික) සැපයුම් මත වක්‍ර තිරස් එකතුව මගින් වෙළඳපොල සැපයුම් වක්‍රයේ දක්වෙන අතර එය සැකසෙන්නේ එක් එක් නිෂ්පාදන ආයතනයක සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයේ අවමයේ සිට ඉහළට නැගෙන ආන්තික පිරිවැය වක්‍ර වල තිරස් එකතුවෙනි.

ii. සලකා බලන භාණ්ඩය බාල භාණ්ඩයක් වන විට මිල වැඩි වන විට මූර්ත ආදායම අඩු වෙයි. එහෙත් එම ඉහළ යන මූර්ත ආදායම හැසිරවෙන්නේ ඉල්ලුම අඩුවෙන ආකාරයටයි. හෙවත් ඉල්ලුම් වක්‍රය වමට විතැන්වන ආකාරයටයි. (ලකුණු 1)

එසේ ම බාල භාණ්ඩයක වුවත් මිල වැඩි වන විට සාපේක්ෂ මිල වැඩිවන නිසා ඉල්ලුම් ප්‍රමාණය අඩු වෙයි. එම නිසා ආදායම් ප්‍රතිවිපාකය සෘණ වන අතරම ආදේශන ප්‍රතිවිපාකය ද සෘණ වෙයි. (ලකුණු 2)

iii. (අ) අනුපූරක භාණ්ඩ (ආ) බාල භාණ්ඩ (ඉ) අත්‍යවශ්‍ය භාණ්ඩ (ල.1x3=3)

iv. Qd=a-bp QS = a+bp Qd = 14 - P Qs = -2 + p

Qd = Qs	Qd = 14 - P
14 - P = -2 +p	Qd = 14 - 8
14 + 2 = P + P	Qd = 6
16 = 2P	හෝ
16/2 = P	Qs = -2 + p
8 = P	Qs = -2 + 8
	Qs = 6



සමතුලිත මිල = රු 8 යි
සමතුලිත ප්‍රමාණය = 6 (ලකුණු 2)

සමතුලිත මිලේදී නිෂ්පාදන අතිරික්තය=

$\frac{(8-2)x6}{2}$ = රු 18 (ලකුණු 2)

(ආ) i.

මිල	අධි ඉල්ලුම් ප්‍රමාණය	අධි සැපයුම් ප්‍රමාණය
5	450	-450
15	450	300

මෙම ලේඛනවලට අදාළ අධි ඉල්ලුම් වක්‍රය හෝ අධි සැපයුම් වක්‍රය ඇසුරින් සමතුලිත මිල පෙන්වා තිබේ නම් (ලකුණු 4)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources



සමතුලිත මිල රු 11 යි

(ii) සෑම මිලකදීම ඉල්ලුම හා සැපයුම අඩු වේ නම් ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත පරිදි වෙනස් වෙයි.

Qd=80-0.2p   Qs=-95+0.5p එවිට

80-0.2p = -95+0.5p

175 = 0.7p

$\frac{175}{0.7} = p$

$\frac{1750}{7} = p$

250 = p සමතුලිත මිල (ලකුණු 2)

සමතුලිත මිලේදී පාරිභෝගික අතිරික්තය = $\frac{\text{උපරිම ඉල්ලුම් මිල - සමතුලිත මිල) x සමතුලිත ප්‍රමාණය}}{2}$

උපරිම ඉල්ලුම් මිල = 80 - 0.2p

0 = 80 - 0.2p

80 = - 0.2p

$\frac{80}{12} = p$

$\frac{800}{2} = p$

400 = p (උපරිම ඉල්ලුම් මිල)

සමතුලිත ප්‍රමාණය = 30

සමතුලිත මිලේදී පාරිභෝගික අතිරික්තය = (400 - 250) x 15

150 x 15

2250 (ලකුණු 2)

3. (i)

මිල	ඉප්‍ර.	සැප්‍ර.	අධි ඉල්ලුම
10	400	0	400
32	150	250	-100



(ලකුණු 3)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

ii. ඉහත භාණ්ඩයට රු 10 ක සහනාධාරයක් ලබා දුන් විට නව සැපයුම්

මිල රු	සැප්‍ර
0	0
25	250

(රූපසටහන නොදක්වා වීජගණිතමය ලෙස ලබාගෙන තිබේනම් ලකුණු ලැබේ)
නව සමතුලිත මිල 25 යි
සමතුලිත ප්‍රමාණය 250 යි (ලකුණු 4)

iii. සහනාධාරයට පසු නිෂ්පාදන අතිරික්තය $= \frac{(35 - 10) \times 250}{2} = \frac{25 \times 125}{2} = 3125$ (ලකුණු 2)

iv. සහනාධාරයේ ශුභ සාධන ප්‍රතිවිපාකය

$$\frac{\text{සහනාධාරය x සමතුලිත ප්‍රමාණයේ වෙනස}}{2}$$ (ලකුණු 2)

$\frac{10 \times 50}{2}$ = රු 250

(ආ) i.

$$170 - 2Q = 20 + 3Qs$$
$$170 - 20 = 3Q + 2Q$$
$$150 = 5Q$$
$$\frac{150}{5} = Q$$

(සමතුලිත ප්‍රමාණය) $30 = Q$

$$p = 170 = 2Q$$
$$P = 170 - 2x30$$
$$P = 170 - 60$$
$$P = 110$$ (සමතුලිත මිල)

සමතුලිත මිල රු 110 යි
සමතුලිත ප්‍රමාණය = 30 යි

ii. සමතුලිත මිලට අදාල
පාරිභෝගික පැහැදම= 110 x 30 = රු. 3300 (ල.2)

(ඉ) i. සමතුලිත ප්‍රමාණය = Qd = 100 - 3p

$$Qd = 100 - 3x10$$
$$Qd = 100 - 30$$
$$Qd = 70$$ (ල.2)

ii. 25% කින් තීරුබද්ද ඉවත් කළ හොත් ආනයන මිල ($\frac{100 \times 10}{125}$ = රු 8) වීම නිසා තීරුබද්ද රු 2 කි.

රු 10 මිල යටතේ දේශීය සැපයුම් ප්‍රමාණය

$Qs = 40 + 2p$
$= 40 + 2 \times 10$
$= 40 + 20$
$= 60$

රු 10 මිල යටතේ ඉල්ලුම් ප්‍රමාණය (සමතුලිත ප්‍රමාණය) 70 කි
එම නිසා අපනයන සැපයුම් ප්‍රමාණය = 70 - 60 = 10 කි.
එම නිසා රටකට අහිමිවන තීරු බදු ආදායම = 2 x 10 රු 20 කි (ල.3)

4. (අ) එකඟ නොවේ.

නිමැවුම් ප්‍රසාරණය කරන විට AVC වක්‍රය හා AC වක්‍රය අතර පරතරය ක්‍රමයෙන් අඩු වේ. AVC වක්‍රය හා AC වක්‍රය අතර වෙනසින් දක්වෙන්නේ සාමාන්‍ය ස්ථාවර පිරිවැයයි. එය නිමැවුම් ප්‍රසාරණය කරන විට ක්‍රමයෙන් අඩු වන නිසා AVC හා AC වක්‍ර අතර පරතරය ද අඩුවේ.

(ආ) එකඟ වේ.

පරිමාණානුකූල පිරිමැසුම් යනු සියලුම යෙදවුම් පමණක් කරමින් නිෂ්පාදනය කරන විට ඒකකයක සාමාණ පිරිවැය අඩුවීමයි. ඒ අනුව පරිමාණානුකූල පිරිමැසුම් හටගන්නා විට දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය පහළට ගමන් කරයි.

(ඇ) එකඟ නොවේ.

මුළු ඵලදාව උපරිම වන විට ස්ථාවර යෙදවුම් වැඩි වේගයකින් ඉහළ නැංවෙන විට ස්ථාවර යෙදවුම්වලට සාපේක්ෂව විචල්‍ය යෙදවුම් පහළ ගොස් හීනවන ඵල ක්‍රියාත්මක වන බැවින් ආන්තික පිරිවැය වැඩි වේගයකින් ඉහළ නගී.

(ලකුණු 2x4)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

Answer

(ඇ) එකඟ නොවේ.

කෙටි කාලයේදී විචල්‍ය යෙදවුම් වැඩි වේගයකින් ඉහළ නංවන විට ස්ථාවර දෙවුම්වලට සාපේක්ෂව විචල්‍ය යෙදවුම් ඉහළ ගොස් හීනවන ඵල ක්‍රියාත්මක වන බැවින් ආන්තික පිරිවැය වැඩි වේගයකින් ඉහළ නගී.

ii.(අ) වෙළඳපොළ මිල රු 80 දී TR = TC වන නිසා ආර්ථික ලාභ ශුන්‍ය වුව ද ප්‍රමාණික ලාභ නිෂ්පාදකයාට හිමිවන බැවින් ආයතනය වසා දැමීමට තීරණය නොකෙරේ. (ලකුණු 2)

(ආ) මිල රු 100 දී නිෂ්පාදකයා අතිප්‍රමාණික ලාභ ලබයි.

නිෂ්පාදකයාගේ ආදායම	=	100 x 85 = 8500
නිෂ්පාදනයාගේ මුළු පිරිවැය	=	80 x 85 = 6800
අතිප්‍රමාණික ලාභය	=	රු 1700

(ඇ) මිල රු 100 දී ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය සාමාන්‍ය ස්ථාවර පිරිවැය x නිමැවුම් ඒකක ප්‍රමාණය

40 x 85 = රු 3400 (ලකුණු 1)

iii.

පූර්ණ තරගකාරී වෙළඳපොල	**ඒකාකාරී තරග වෙළඳපොල**
සමජාතීය භාණ්ඩ නිෂ්පාදනය වීම	ප්‍රභේද භාණ්ඩ නිෂ්පාදනය වීම
නිෂ්පාදකයා මිල ගන්නෙකි	නිෂ්පාදකයා මිල තීරකයෙකි
ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වෙයි	ඉල්ලුම් වක්‍රය නම්‍ය වේ
පූර්ණ තොරතුරු ගලා යාමක් ඇත	පූර්ණ තොරතුරු ගලා යාමක් නැත
P=AP=MR වේ	P>MC

(ලකුණු 4)

iv. නිෂ්පාදන සාධකය සැපයුම් අනම්‍යතාව වැයවන විට මුළු ඉපැයුම තුළ ආර්ථික බදු කුලිය සංක්‍රාම ඉපයුම ඉපයුමට වඩා වැඩි වන අතර සැපයුම පූර්ණ අනම්‍ය නම් මුළු ඉපයුම ම ආර්ථික බදු කුලියකි. (ලකුණු 3)





5. i. ප්‍රාථමික ආදායම් යනු,

නිෂ්පාදන ක්‍රියාවලියේ නිරත වීමේ ප්‍රතිඵලයක් ලෙස හෝ නිෂ්පාදනය සඳහා අවශ්‍ය කෙරෙන වත්කම් හිමිකරගෙන සිටීමේ ප්‍රතිඵලයක් ලෙස හෝ ආයතනික ඒකකවලට ලැබෙන ආදායමයි. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා සහභාගී වූ සියලුම නිෂ්පාදන සාධක සඳහා කරන ලද සාධක ගෙවීම් මෙයට ඇතුළත් වේ.

ප්‍රාථමික ආදායම්වල මුළු එකතුව සමස්ථ නිෂ්පාදනයේ එකතු කළ අගය නිරූපණය කරයි. (ලකුණු 2)

ප්‍රධාන සංරචක

1. සේවක ආදායම්
2. දළ මෙහෙයුම් අතිරික්තය
3. මිශ්‍ර ආදායම්
4. නිෂ්පාදනය මත ශුද්ධ බදු

(ලකුණු 2)

ii.(අ)

කුටුම්බ අවසන් වියදම	=	6000		
ආණ්ඩුවේ අවසන් පරිභෝජන වියදම	=	4000		
කුටුම්බ වෙත සේවා සපයන ආයතන පරිභෝජන වියදම	=	500		
මුළු පරිභෝජන වියදම	=		10500	
දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදන වියදම	=	3500		
තොග හෙවත් පරිලේඛණ වෙනස් වීම	=	1000		
වටිනා දෑ අත්පත් කර ගැනීම් හා අත්හැරීම්	=	200		
දළ දේශීය ප්‍රධාන සම්පාදන වියදම	=		4700	
දළ දේශීය වියදම	=		15200	(ලකුණු 1)
ශුද්ධ අපනයන (අපනයන - ආනයන)	=		- 1200	(ලකුණු 1)
දළ දේශීය නිෂ්පාදිතය	=		14000	(ලකුණු 1)

(ආ)

දළ දේශීය නිෂ්පාදිතය	=	14000	
විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම	=	-700	
දළ ජාතික ආදායම	=	13300	(ලකුණු 1)

(ඉ)

දළ ජාතික ආදායම	=	13300	
විදේශීය ශුද්ධ ජංගම සංක්‍රම	=	1700	
වැය කළ හැකි දළ ජාතික ආදායම	=	14000	(ලකුණු1)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

(ඊ) කුටුම්බ අවසන් පරිභෝජන වියදම = 6000
කුටුම්බ වෙත සේවා සපයන ආයතනවල ප.වි. = 500
රජයේ පෞද්ගලික පරිභෝජන වියදම (4000 - 2400) = 1600
මූලික මිල යටතේ සමස්ත එකතු කළ අගය = 14600 (ලකුණු 1)

(ඒ)වැය කළ හැකි දළ ජාතික ආදායම = 14000
මුළු පරිභෝජන වියදම = 10500
දළ ජාතික ඉතිරිකිරීම් = 3500
(විකල්ප ක්‍රම පිළිබඳ සැලකිලිමත් වන්න)

iii. ඉතුරුම් සිදුවන විට වියදම් ප්‍රවාහයේ ගිලිහීමක් හෙවත් කාන්දුවීමක් ඇති කරයි. ඒ නිසා සමාහාර ඉල්ලුම සංකෝචනය වේ. ආයෝජන වියදම් ප්‍රවාහනයට එකතු වීමක් හෙවත් විදීමක් සිදු කරයි. ඒ නිසා සමහර ඉල්ලුම ප්‍රසාරණය වේ. (ල.1)
ඉතුරුම්වලට සාපේක්ෂව ආයෝජන විශාල වන විට (I>S) සමාහාර ඉල්ලුම ඉහළ නගින අතර එනිසා මූර්ත නිමවුම් මට්ටම ප්‍රසාරණය වේ. (ල.1)
ඉතුරුම්වලට සාපේක්ෂව ආයෝජනය කුඩා වන විට (I<S) සමාහාර ඉල්ලුම පහළ වැටෙන අතර ඒ නිසා මූර්ත නිමවුම් මටට්ම සංකෝචනය වේ. (ල.1)
ඉතුරුම් සහ ආයෝජනය එකිනෙකට සමාන වන විට (I=S) සමාහාර ඉල්ලුම නොවෙනස්ව පවතින අතර මූර්ත නිමවුම් මට්ටම සමතුලිත මට්ටමට පත් වේ. (ල.1)

iv. Y = E
Y = C + I + G + X - M
Y + 100 + 0.8Yd + 250 + 400 + (-250) (ල.1)
Y = 500 + 0.8 (Y-300+100)
Y = 500 + 0.8y - 160 (ල.1)
Y.8y = 340
.2y = 340
Y = $\frac{340}{.2}$
Y = 1700 (ල.1)

රාජ්‍ය බදු ගුණකය = $\frac{-6}{1 -6}$
= $\frac{-0.8}{-4}$

$\Delta y = 4 \times 200$
$\Delta y = 800$
y = 1700 + 800
Y = 2500 (ලකුණු 1)

6. i. භාණ්ඩ හා සේවා හුවමාරු කිරීමේදී ගෙවීම් මාධ්‍යයක් වශයෙන් පොදුවේ පිළිගනු ලබන ඕනෑම දෙයක් මුදල් වශයෙන් සලකනු ලබයි. (ලකුණු 2)

- හොඳ මුදලක පහත සඳහන් ලක්ෂණ දැකිය හැකිය.
- පොදු පිළිගැනීමක් තිබේ.
- කල් පැවැත්ම
- සමජාතීය බව
- අනුකරණය කළ නොහැකි වීම
- කුඩා කොටස්වලට බෙදිය හැකි වීම
- පහසුවෙන් හඳුනා ගත හැකි වීම
- පහසුවෙන් එහා මෙහා ගෙන යා හැකි වීම
- වටිනාකම ස්ථාවරව පැවතීම

(1/2 x 4 = 2)

ii. දළ දේශීය නිෂ්පාදිතයේ අන්තර්ගත භාණ්ඩ හා සේවාවන්හි මිල මට්ටමේ සිදුවන වෙනස්වීම් හෙළි කරන දර්ශකයයි. එය පහත පරිදි ගණනය කරයි.

දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනය = $\frac{\text{පවත්නා මිල අනුව ද.දේ.නි}}{\text{ස්ථාවර මිල අනුව ද.දේ.නි}} \times 100$ (ල.2)

කිසියම් වර්ෂයක දේශීය නිෂ්පාදිතය පවත්නා මිලෙන් සහ ස්ථාවර මිලෙන් ගණනය කිරීමේදී පවත්නා මිලට අනුව ලැබෙන වටිනාකම ඉහළ යාම තුළින් පිළිබිඹු වන්නේ ආර්ථිකයේ මිල මටට්ම ඉහළ යාමකි. නැතහොත් ද.දේ.නි අවධමනයේ අගය ඉහළ යාම තුළින් පිළිබිඹු වන්නේ සාමාන්‍ය මිල මට්ටමේ ඉහළ යාමයි. එම ඉහළ යාමේ ප්‍රතිශතය උද්ධමන අනුපාතිකය වේ. (ලකුණු 2)

iii. ද්‍රවශීලතාව ආරක්ෂා කර ගැනීම
ලාභදායකත්වය ඉහළ නංවා ගැනීම (ලකුණු 1)
ද්‍රවශීලතාව යනු පාඩු නොවී වත්කම් ඉක්මනින් මුදල් බවට හැරවීමේ හැකියාවයි. තම තැන්පතු මුදල් තමන්ට ඕනෑම විටෙක බැංකුවෙන් ආපසු ලබා ගත හැකිය යන මහජන විශ්වාසය ආරක්ෂා කිරීම සඳහා සෑම අවස්ථාවකම වාණිජ බැංකුවලට සිය ද්‍රවශීලතාව ආරක්ෂා කරගැනීමට සිදු වෙයි. (ලකුණු 1)
ලාභදායකත්වය යනු ණයක් ලබාදීමේ සහ ආයෝජන වත්කම් මගින් උපයා ගන්නා ආදායමෙන් තැන්පතු සඳහා ගෙවන පොලී වියදම් අඩු කිරීමෙන් ලැබෙන පොලී ආදායමයි. (ලකුණු 1)
වාණිජ බැංකු සිය ද්‍රවශීලතාව ආරක්ෂා කර ගැනීමට යාමේදී ලාභදායකත්වය අඩු වේ. ලාභදායකත්වය ආරක්ෂා කර

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

ගැනීමට යාමේදී ද්‍රවශීලතාව අඩු වේ. **Answer**

iv. පවත්නා සංචිතය = රු. මි 6000

ද්‍රව්‍ය සංචිතය රු 10000 ○ $\frac{20}{100}$ = රු. මි 2000

අධි සංචිත ප්‍රමාණය = රු. මි 4000

මෙම බැංකුවට ලබා දිය හැකි අලුත් ණය ප්‍රමාණය රු. මිලියන 4000 කි.

මැවිය හැකි උපරිම ණය ප්‍රමාණය = රු. 4000 x 5

රු. 20 000 (ල.2)

v. (අ) පදනම් මුදල්

කිසියම් රටක සමස්ත මුදල් සැපයුම පදනම සපයන මහ බැංකුව සතු සෘජු මූල්‍ය වගකීම් පදනම් මුදල් වේ.

මුදල් ගුණකය

ආර්ථිකයේ මුළු මුදල් සැපයුම හා පදනම් මුදල් අතර සම්බන්ධය මුදල් ගුණකයෙන් දක්වේ.

මුදල් ගුණකය = $\frac{\text{මුදල් සැපයුම}}{\text{පදනම් මුදල්}} = \frac{M}{H}$

(ආ)මුදල් වෙළඳපොළ

වසරකට අඩු කාලයකින් පරිණතවන භාණ්ඩාගාරර බිල්පත් වාණිජ පත්‍රිකා හා තැන්පතු සහතික පත් වැනි පොළී උපයන කෙටි කාලීන වත්කම් ගණුදෙනු සිදුවන වෙළඳපොළයි. (ල.1)

ප්‍රාග්ධන වෙළඳපොල

වර්ෂයකට වඩා වැඩි කාලයක් පරිණත වන මූල්‍ය උපකරණ හා සමාගම්වල කොටස් යනාදිය හුවමාරු වෙන වෙළඳපොළ ප්‍රාග්ධන වෙළඳපොලයි. (ලකුණු 1)

7 i. පාරිභෝගිකයාට හා නිෂ්පාදකයාට තීරණ ගැනීමට අවශ්‍ය කරන තොරතුරු වෙළෙඳපොළ මගින් සම්පූර්ණයෙන්ම නිවැරදිව ලබාගත නොහැකිවීම අපූර්ණ තොරතුරු යනුවෙන් හැඳින්වේ.

♦වෙළඳ පොලක පූර්ණ තොරතුරු නොලැබීම කෙරෙහි පහත සඳහන් සාධක බලපායි

ප්‍රචාරය නිසා සැබෑ තොරතුරු විකෘති කොට දැක්වීම.

♦සංකීර්ණ තාක්ෂණික කරුණු පිළිබඳ ඇතැම් තොරතුරු මඳීමට අපහසු වීම.

♦ඇතැම් ප්‍රතිලාභ පිළිබඳ අවිනිශ්චිතතා පැවතීම. (ලකුණු 1)

♦වෙළඳපොළෙන් තොරතුරු නොලැබෙන විට නිෂ්පාදකයා හා පාරිභෝගිකයා ගනු ලබන් තීරණ නිසා සම්පත් බෙදී යාම අකාර්යක්ෂම වේ. ඒ අනුව තොරතුරු නොලැබීම් වෙළෙඳපොළ අසමත් වීමට හේතු වේ (ලකුණු 2)

ii. එකඟ නොවේ

මෙය එකිනෙකට වෙනස් වූ සංකල්ප දෙකකි (ලකුණු 1)

පොදු හොදු භාණ්ඩ යනු සාමූහික ව පරිභෝජනය කරනු ලබන භාණ්ඩ වේ ඒවායේ ප්‍රධාන ලක්ෂණ දෙකකි.

1. ගෙවීමක් නොකරන පුද්ගලයන් අදාළ භාණ්ඩ පරිභෝජනයෙන් ඉවත් කල නොහැකිවීම.

2. පරිභෝජන තරගකාරීත්වය නොමැතිවීම

උදාහරණ - ඔරලෝසු කණු, ජාතික ආරක්ෂාව වැනි

පරිභෝජනය සීමා කළ නො නොහැකි පරිභෝජනයෙ තරගකාරීත්වය දැකිය හැකි සම්පත් පොදු සම්පත් වේ

1. ප්‍රතිලාභ ලබන්නන් හා පරිභෝජනය සීමා කළ නො නොහැකි වීම

2. පරිභෝජනයේ තරගකාරීත්වයක් දක්නට ලැබීම.

උදා:- මත්ස්‍ය සම්පත්, තෘණ භූමි (ලකුණු 3)

iii. සාර්ව ආර්ථික අරමුණු ඉටුකර ගැනීම සඳහා ආණ්ඩුවේ වියදම් බදු අයකිර කිරීම් සහ ණය ගැනීම් සඳහා අදාළ වෙනස්කම් සිදු කිරීම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය නම් වෙයි.

iv. (අ) වර්තන ගිණුමේ ශේෂය

සුළු ආදායම = රු මි. 165000

පුනරාවර්තන වියදම් = රු මි. 175000

= රු මි. -10000 (ලකුණු 2)

(ආ) සමස්ත ගිණුම් ශේෂය

මුළු ආදායම් = රු මි. 170000

මුළු වියදම් = රු මි. (200000)

සමස්ථ ශේෂය = රු මි. - 30000 (ලකුණු 2)

(ඉ) ප්‍රාථමික ගිණුමේ ශේෂය =

සමස්ථ ගිණුමේ ශේෂය = රු මි. -30000

පොලී ගෙවීම් = රු මි (-21000)

ප්‍රාථමික ගිණුමේ ශේෂය = රු මි. - 9000

(විකල්ප ප්‍රවේශ ඔස්සේ ද ගණනය කළ හැකිය) =

♦විශාල වශයෙන් ණය ලබා ගැනීම නිසා පොලී ගෙවීම් ඉහළ යාම හේතුවෙන් රාජ්‍ය ඉතුරුම් පහළ යාම සහ ආයෝජනය පහළ යාම.

♦ණය වාරික සහ පොලිය ඉහළ යාම හේතුවෙන් රාජ්‍ය වියදම් ඉහළ යාම.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

♦රාජ්‍ය මූල්‍ය කලමනාකරණය වඩාත් දුෂ්කර වීම
♦පෞද්ගලික අංශය වෙතින් සම්පත් ගලා නොයාම සහ ණය පොලී අනුපාතිකය ඉහළ යාම හේතුවෙන් ආර්ථිකයේ තෙරපීමක් ඇතිවීම. (තෙරපුම් ප්‍රතිවිපාක)
♦විදේශ ණය මගින් රාජ්‍ය ණය පියවීම හේතුවෙන් ජාත්‍යන්තර ණය අර්බුදයට මුහුණ දීමට සිදුවීම
♦ප්‍රසාරණාත්මක ණය මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම නිසා ආර්ථිකයේ භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාම
♦විදේශ ණය වාරික හා පොලිය ඉහළයාමෙන් තෙරරපුම් ශේෂ දුෂ්කරතා ඇතිවීම
♦වර්තමාන පරම්පරාව විසින් අනාගත පරම්පරාව වෙත ණයබර පැටවීම (ලකුණු 1x4=4)

8. (1) රූපවාහිනී යන්ත්‍ර නිරපේක්ෂ වාසි කොරියාවේ ඇත.
(අ) පරිගණක යන්ත්‍ර නිරපේක්ෂ වාසි කොරියාවේ ඇත. (ලකුණු 1)
(ආ) රූපවාහිනී ආවස්ථික පිරිවැය කොරියාව $\frac{\Delta \text{ රූපවාහිනී}}{\Delta \text{ පරිගණක}}$

$= \frac{8}{16} = 0.5$

රූපවාහිනී ආවස්ථික පිරිවැය $= \frac{12}{48} = 0.25$

පරිගණක ආවස්ථික පිරිවැය කොරියාව $= \frac{\Delta \text{ පරිපූරක}}{\Delta \text{ රූපවාහිනී}}$

$= \frac{16}{8} =12$

පරිගණක ආවස්ථික පිරිවැය එක්සත් ජනපදය $= \frac{48}{12} = 4$

පරිගණක නිෂ්පාදනයේ සාපේක්ෂ වාසි කොරියාවේ ඇත (ලකුණු 2)

ii. සලාක හෙවත් කෝටා නියම කිරීම
දේශීය නිෂ්පාදකයින්ට සහනාධාර හෝ දිරිගැන්වීම් ලබාදීම
ප්‍රපතනය
ස්වේච්ඡාවෙන් අපනයන සලාක පනවා ගැනීම
විදේශ විනිමය පාලනය
ආනයන අපනයන පාලන සීමා පැනවීම්
වෙළෙඳපොළ සම්බාධක පැනවීම්
පරිපාලන සහ තාක්ෂණික ප්‍රමිති නියම කිරීම් (ලකුණු 1x4)

iii. බහුපාර්ශ්වීය වෙළඳ සංවිධානයක් යනුවෙන් අදහස් කරනුයේ සීමිත රටවල් කිහිපයක් වෙනුවට සියලුම රටවල්ට නිදහසේ වෙළඳාම් කිරීමට ප්‍රවේශ වීමට ඉඩ සැලසෙන නීතිමය වැඩපිළිවෙළක් ය.
උදා - තීරුබදු සහ වෙළඳාම් පිළිබඳ පොදු සම්මුතිය
ලෝක වෙළෙඳ සංවිධානය. (ලකුණු 1)

iv. ද්වි පාර්ශ්වික
ඉන්දු ලංකා නිදහස් වෙළඳ ගිවිසුම
පකිස්ථානුතානු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම
ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (ලකුණු 1x2)

බහු පාර්ශ්වික
ආසියානු ශාන්තිකර නිදහස් වෙළෙඳ ගිවිසුම
දකුණු ආසියා නිදහස් වෙළෙඳ ගිවිසුම
බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා වූ බහු ආංගික නිදහස් වෙළඳ ගිවිසුම (ලකුණු 1x2)

v (අ) ණය සඳහා පොලී ගෙවීම් ආයෝජන ආදායම් ගෙවීම් ලෙස සටහන් කරනු ඇත. ඩොලර් 12000 ගෙවීම ශ්‍රී ලංකා ගෙවුම් ශේෂ ලේඛනයේ ජංගම ගිණුමේ ප්‍රාථමික ආදායම් ගිණුම හර ශේෂයක් ලෙස සටහන් කරන අතර මූල්‍ය ගිණුමේ මුදල් තැන්පත් ශීර්ෂය යටතේ බැර සටහනක් ලෙස සටහන් කෙරේ. (ලකුණු 1)

(ආ) ශ්‍රී ලංකාව ගෙවුම් තුළන ලේඛනයේ මූල්‍ය ගිණුමේ අනෙකුත් ආයෝජන යටතේ ඇති ණය ශීර්ෂය යටතේ බැර ශේෂයක් ලෙස ද ණය වශයෙන් ලබාගත් විදේශ මුදල් ප්‍රමාණය මූල්‍ය ගිණුමේ මුදල් තැන්පත් ශීර්ෂය යටතේ හර සටහනක් ලෙස ද ඇතුළත් කෙරේ. (ලකුණු 1)

vi. අපනයන විවිධාංගීකරණය කිරීම
සාම්ප්‍රදායික අපනයන දිරිමත් කිරීම
අපනයන ප්‍රවර්ධන කලාප පිහිටුවීම
විදේශ රටවල් සමග වෙළඳ ගිවිසුම්වලට එළඹීම
අනාගත ආදේශ කර්මාන්ත වැඩි දියුණු කිරීම
අත්‍යවශ්‍ය ආනයන හැර අනෙකුත් ආනයන ධෛර්යමත් කිරීමට කටයුතු කිරීම
විනිමය අනුපාතිකය ක්ෂය වීමට ඉඩහැරීම හෝ අවප්‍රමාණ කිරීම. (ලකුණු 4)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

Answer

9. i. ආර්ථික වෘද්ධිය යන්නෙන් අදහස් වන්නේ ආර්ථිකයක විභව නිමැවුම් දිගු කාලයක් තිස්සේ අඛණ්ඩව වර්ධනය වීමයි. මෙය මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රමාණාත්මකව සිදුවන වර්ධනයකි.
සම්පත් සම්භාරය ඉහළ යාම හා ඵලදායීතාව ඉහළ යාම ආර්ථික වෘද්ධිය බිහි කරන සාධක වේ.
සංවර්ධනය යනු මිනිස් ජීවිතවල ගුණාත්මක වර්ධනයකි. ආර්ථික වෘද්ධියේ ප්‍රතිලාභ ජනතාව අතර බෙදී ගොස් ජනතාවගේ ජීවන තත්වය උසස් වීමකි. සංවර්ධනයේදී මූර්ත නිමැවුම් ඇතිවන ප්‍රමාණාත්මක වර්ධනයට අමතරව දිළිඳුබව අඩුවීම ආදායම ව්‍යාප්තියේ විෂමතා අඩුවීම විරැකියාව අඩුවීම සතුටුදායක අධ්‍යාපන මට්ටමක් ඉහළ සෞඛ්‍ය හා පෝෂණ මට්ටමක් පිරිසිදු පරිසරයක් වැනි ගුණාත්මක ලක්ෂණ ඇති වේ.
(ලකුණු 4)

ii. විදේශ ආයෝජන ප්‍රමාණවත් නොවීම
යටිතල පහසුකම්වල ගුණාත්මක බව අඩුවීම
සාර්ව ආර්ථික අස්ථායිතාව
දේශපාලන අස්ථාවර බව
ආර්ථික ප්‍රතිපත්තිවල අවිනිශ්චිතබව
බලශක්ති පිරිවැය ඉහළ මට්ටමක පැවතීම
විනිමය අනුපාතය ක්ෂයවීම
රාජ්‍ය මූල්‍ය ගැටලු ඇතිවීම
අපනයන විවිධාංගීකරණය නොවීම (කරුණු 4 ට (ලකුණු 4)

iii. මෑතකාලීනව ශ්‍රී ලංකාවේ දරිද්‍රතා ප්‍රමාණයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණය වන්නේ ජාතික මට්ටම අනුව ද අංශ වශයෙන් ද ගත්විට දරිද්‍රතා සීග්‍රයෙන් පහත වැටී ඇති බවයි.

	දරිද්‍රතා මට්ටම	
	2012 / 13	2016
ශ්‍රී ලංකාව	6.7	4.1
නාගරික	2.1	1.9
ග්‍රාමීය	7.6	4.3
වතු	10.9	8.8

(ලකුණු 2)

- සංඛ්‍යා සටහන අනුව දරිද්‍රතාව අඩු වී ඇති නමුත් නාගරික අංශයට සාපේක්ෂව ග්‍රාමීය හා වතු අංශවල ඉහළ දරිද්‍රතාවක් පවතී. ඊට බලපා ඇති හේතු වන්නේ,
- දරිද්‍රතා මට්ටම ඉහළ අගයක් ගෙන ඇති ග්‍රාමීය අංශය හා වතු අංශයේ අධ්‍යාපනය සෞඛ්‍ය සේවා සහ යටිතල පහසුකම් හා රැකියා අවස්ථා නාගරික අංශයට සාපේක්ෂව අඩු මට්ටමක පැවතීමයි.
- ග්‍රාමීය අංශයේ කෘෂිකාර්මික අංශය පදනම් කරගෙන ජීවනෝපාය මාර්ගවලින් ලැබෙන ආදායම අඩුවීම
- දිස්ත්‍රික්ක අනුව ඉහළම දරිද්‍රතාව කිලිනොච්චි දිස්ත්‍රික්කයෙන්ද පහළම දරිද්‍රතාව කොළඹ දිස්ත්‍රික්කයෙන්ද වාර්තා වේ.

(ලකුණු 2)

iv. ජාතික දරිද්‍රතා ක්‍රම යනු ආහාර හා ආහාර නොවන අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පරිභෝජනය සඳහා පුද්ගලයෙකුට දිනකට කිලෝ කැලරි 2030 අවශ්‍යතාවක් සපුරා ගැනීමට වැය වන වියදම ජාතික දරිද්‍රතා ඉම ලෙස හැඳින්වේ. 2016 වර්ෂය සඳහා දරිද්‍රතා ඉම රු 4166 කි. (ලකුණු 2)
පංචමක අපකිරණ අනුපාතයෙන් දැක්වෙන්නේ ආදායම් උපනයනයන්ගේ ඉහළ ම ආදායම හිමි කරගත් පංචමකයේ (20%) සාමාන්‍ය ආදායම පහළම ආදායම උපයාගත් පංචමකයේ සාමාන්‍ය ආදායම අතර අනුපාතයයි. මේ මගින් ආදායම විෂමතාවයේ ස්වරූපය මැනිය හැක. මෙ ගණනය කරන්නේ,

$$\text{පංචමක අපකිරණ අනුපාතය} = \frac{\text{ඉහළම ආදායම උපයාගත් පංචමකයේ සාමාන්‍ය ආදායම}}{\text{පහළම ආදායම උපයාගත් පංචමකයේ සාමාන්‍ය ආදායම}}$$

v. 2017 වසරේ මානව සංවර්ධන වාර්තාවට අනුව මානව සංවර්ධන දර්ශකයේ සංඛ්‍යාත්මක අගය හා ස්ථානය අනුව දකුණු ආසියානු කලාපයේ රටවල් අතර ඉහළම මානව සංවර්ධනය සහිත රට ශ්‍රී ලංකාව වේ.

රට	ස්ථානය	මානව සං. දර්ශකය
ශ්‍රී ලංකාව	73	0.770
මාලදිවයින	105	0.717
ඉන්දියාව	131	0.460
පකිස්තානය	147	0.562
නේපාලය	145	0.574
භූතානය	132	0.612

ශ්‍රී ලංකාව ඇතුළු රටවල් දෙකක දර්ශක අංක ලියා ඇත්නම් (ලකුණු 3)
මානව සංවර්ධන දර්ශනය හැඳින්වීම (ලකුණු 1)

10. i. අපනයන තරගකාරීත්වය හා අපනයන විවිධාංගීකරණය මගින් ලෝක වෙළඳපොල තුළ සිය කොටස් පුළුල් කිරීම කර ගැනීම
- ගෙවුම් ශේෂ ගැටලු නිරාකරණය
- විදේශ විනිමය ගැටලු නිරාකරණය
- ආර්ථික වර්ධන උපාය මාර්ග ලෙස අපනයන කර්මාන්ත ප්‍රවර්ධනය

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

Answer

- විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම
- සේවා නියුක්ති අවස්ථා පුළුල් කරීම සඳහා අපනයන වෙත යොමු වූ කර්මාන්ත ප්‍රවර්ධනය
(ඕනෑම කරුණු 4කට ලකුණු 4යි.)

ii. 2016 වසරේ විදේශ රැකියා සඳහා පිටත් යන්නන්ගේ 7.8% පහළ යාමක් වාර්තා විය.
- දකුණු කොරියාවේ රැකියා සඳහා පිටත්වීම සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ ද ඉන් වැඩි ප්‍රතිශතයක් (79%) නුපුහුණු ශ්‍රමික කාණ්ඩයට අයත් වීම
- 2015 වසරේ දේශ ප්‍රේරණ ලැබීම් අඩුවීමක් වාර්තා විය. එය 2016 වන විට මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කර ඇත.
- මැදපෙරදිග රටවල රැකියා සඳහා පිටත් වන ශ්‍රමිකයන්ගේ අඩුවීම හා මැද පෙරදිග රටවල ආර්ථික පසුබෑම ක්‍රම ඉල්ලුම් අඩුවීමට හේතු විය.
- 2017 අය වැය මගින් නුපුහුණු ශ්‍රමිකයන්ගේ අවම වැටුප 350 ලෙසට පුහුණු ශ්‍රමිකයන්ගේ අවම වැටුප 450 ලෙස නියම කරන ලදී. (ලකුණු 4)

iii. ඵලදායීතාවය ඉහළ යාම
- ආර්ථික වෘද්ධිය වේගවත් වීම
- ආයෝජකයන්ගේ පෞද්ගලික පිරිවැය අඩුවීම ඉවහල් වීම
- අපතේ යාම් හා නාස්ති වීම් අවම වීම
- කලමනාකරණය හා සම්බන්ධීකරණය කාර්යක්ෂමවීම
- ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු ඉවහල්වීම
- සමාජ සංවර්ධනයට හේතු වේ.
(ආර්ථික සමාජයීය වැදගත්කම 2 බැගින් ඇත්නම් ලකුණු 4 දෙන්න) (ලකුණු 4)

iv. ආණ්ඩු බලය වෙනස් වීම
- වරින් වර ඇති වූ හිඟය ගංවතුර වන සතුන්ගෙන් වන හානි
- ආසියාතික මූල්‍ය අර්බුද
- ගෝලීය ආර්ථිකයේ රටවල් දිගින් දිගටම ඇති වූ අර්බුද
- ලෝක ආහාර හිඟය
- ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හා විවිධ කලාපවල සිදු වූ ස්වභාවික උපද්‍රව (ලකුණු 4)

v. ජනතාව - දිළිඳුකම හා සාගින්න අවසන් කිරීම
පෘථිවිය - ස්වභාවික විපර්යාසවලට කඩිනම් පියවර ගැනීම
සෞභාග්‍ය - සියලු මනුෂ්‍ය වර්ගයා සමෘද්ධිමත් හා තෘප්තිමත් ජීවිත භුක්ති විඳින බව තහවුරු කිරීම.
සාමය - බිය හා ප්‍රචණ්ඩත්වයෙන් තොර සාමකාමී සාධාරණ සමාජය
හවුල් කටයුතු - ගෝලීය හවුල් කරුවන්ගෙ හා සියළුම රටවලින් සියළුම පර්ශවයන්ගෙන් හා සියළුම ජනතාවගේ දායකත්වය ලබා ගැනීම (ලකුණු 4)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources